ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය

பாதுகாப்பு சேவை கட்டளை மற்றும் பதவிநிலை கல்லூரி

Defence Services Command and Staff College



වාර්ෂික වාර්තාව
2020



வருடாந்த அறிக்கை
2020





ANNUAL REPORT
2020

MESSAGE FROM THE COMMANDANT



The Annual Report - 2020 of the Defence Services Command and Staff College is published to appreciate the effort taken during the year for the conduct of the DSCSC Course No 14. It is worthwhile to mention the involvement of faculty and permanent staff on the success of all tasks in the year of review and I expect to see the same effort in subsequent years.

The year 2020 was a challenging, but eventful one, for all of us at the college. Even though the COVID-19 pandemic hampered many events in our annual calendar, we were still able to organize all the significant events by planning alternatives and strictly following the stipulated health guidelines for the prevention of COVID-19. It must be noted that the bio bubble concept and conduct of lectures online took us into a hybrid learning system and it paved the way for the course to run smoothly and educate both the Local and Foreign Student Officers as anticipated. I was proud to witness the successful conclusion of the Graduation Ceremony as the final event of the year.

We look forward to achieving better results in succeeding years and implementing the innovative activities under this prevailing situation. It will be evident that most of the new activities need better review with the past activities, as this report will set a picture of our organizational management effectiveness in human, financial, material and time during the year of review. Therefore, I believe that this report will provide you a professional understanding on achieving the vision, mission and objectives of the college along with the core values.

Finally, it is vital to mention that organizational achievements cannot be merely achieved, it comes into fruition through the combination of forecasted planning, creative organizing, fruitful directing and standard controlling along with top, middle and lower level contribution.

IHMNN HERATH RSP USP psc
Major General
Commandant
Defence Services Command and Staff College

වාර්ෂික වාර්තාව

2020

පටුන

		පිටු අංකය
1.	ඉතිහාසය	1 - 2
2.	දැක්ම, මෙහෙවර සහ අරමුණු	2 - 3
3.	මාණ්ඩලික විද්‍යාලයේ සංවිධාන ව්‍යුහය	3 - 6
4.	විෂය නිර්දේශය	6 - 7
5.	පුහුණු ක්‍රියාකාරකම් - ආසේඅමාවි පාඨමාලා අංක 14	8 - 32
6.	පාලන සහ භාථ කාර්ය්‍ය සම්පාදනය	32 - 38
7.	නිර්දේශ	38
8.	සමාලෝචනය	38

ඇමුණුම් :

අ.	ගණකාධිකාරිගේ ප්‍රකාශය	අ 1
ආ.	මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය	ආ 1- ආ 12
ඇ.	අභ්‍යන්තර විගණකගේ ප්‍රකාශය	ඇ 1
ඈ.	අධ්‍යාපන සංවර්ධන ප්‍රගතිය - කාර්ය සාධක වාර්ථාව	ඈ 1 - ඈ 4
ඉ.	විගණකාධිපති වාර්තාව	ඒ 1 - ඒ 8

වගු සටහන

		පිටු අංක
වගුව - 1	පාඨමාලා අංක 14 හදාරන ලද ශිෂ්‍ය නිළධාරීන් සංඛ්‍යාව	7
වගුව - 2	පාඨමාලා අංක 14 හදාරන ලද ශිෂ්‍ය නිළධාරීන්ගේ ප්‍රතිඵල	7
වගුව - 3	වාහන සාරාංශය	33
වගුව - 4	යුධ හමුදාවට අයත් වාහන විස්තරය	33
වගුව - 5	නාවික හමුදාවට අයත් වාහන විස්තරය	34
වගුව - 6	ගුවන් හමුදාවට අයත් වාහන විස්තරය	34
වගුව - 7	ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් ලබාදී ඇති වාහන විස්තරය	34
වගුව - 8	කුලී ගෙවීමේ පදනම මත පවරාගෙන ඇති වාහන විස්තරය	35

වාර්ෂික වාර්තාව - 2020
ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය

ඉතිහාසය.

1. ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය ප්‍රථමයෙන් යුධ හමුදා අණ හා මාණ්ඩලික විද්‍යාලය වශයෙන් 1998 මාර්තු මස 16 වන දා ශිෂ්‍ය නිලධාරීන් 26 දෙනෙකුගෙන් ආරම්භ කරන ලදි. එහෙත් විද්‍යාලය නිල වශයෙන් විවෘත කරනු ලැබුයේ එවකට යුද හමුදාපති ලුතිතන් ජෙනරාල් ආර් ද එස් දඳුවන්ත ආර්ඩබ්පි ආර්එස්පි වීඑස්වී යුඑස්පි එන්ඩීසී පීඑස්සී ගේ ආරාධනයෙන් එවකට ජනාධිපතිව සිටි අතිගරු චන්ද්‍රිකා බණ්ඩාරණායක කුමාරතුංග මැතිණිය විසින් 1998 අගෝස්තු මස 28 වන දින ය.

2. බ්‍රිතාන්‍ය යුද හමුදා මාණ්ඩලික විදුහලේ ලුතිතන් කර්නල්වරුන් දෙදෙනෙකුගේ උපදේශකත්වයෙන් බ්‍රිතාන්‍ය මාණ්ඩලික විද්‍යාලීය විෂය මාලාව අනුගමනය කරමින් ශ්‍රී ලංකා යුද හමුදාවේ අවශ්‍යතාව අනුව විෂය නිර්දේශය පිළියෙල කරන ලදි. යුද හමුදා අණ හා මාණ්ඩලික විද්‍යාලය ආරම්භයේදී මෙම නිලධාරීන් විසින් පුහුණු ලේඛන සැපයීමෙන් හා උපදේශක නිලධාරීන්ගේ උපදේශන හැකියාවන් ප්‍රගුණ කිරීම මගින් විද්‍යාලයේ සාර්ථකත්වය සඳහා විශේෂ දායකත්වයක් ලබාදෙන ලදි.



1998 අගෝස්තු 28 දින සිදුවූ විවෘත කිරීම

3. තෝරාගත් යුද හමුදා නිලධාරීන්ගේ අණ සහ මාණ්ඩලික රාජකාරීන්හි වෘත්තීය දැනුම හා අවබෝධය වර්ධනය කිරීමේ අරමුණින් යුධ හමුදා අණ හා මාණ්ඩලික විද්‍යාලය ආරම්භ කරන ලදි. මීට අමතරව ශ්‍රී ලංකා නාවික හා ගුවන් හමුදා නිලධාරීන් කිහිපදෙනෙකු ද මෙම පාඨමාලාවට තෝරා ගත් අතර, ඔවුන් ද යුධ හමුදා අණ හා මාණ්ඩලික විද්‍යාලය පාඨමාලා අංක 1 සිට පාඨමාලාවන් නදාරන ලදි. 1998 සිට 2006 දක්වා විද්‍යාලය විසින් උපාධිධාරී නිලධාරීන් 252 දෙනෙකු බිහිකළ අතර, යුද හමුදා නිලධාරීන් 208 ක්, නාවික හමුදා නිලධාරීන් 22 ක්, ගුවන් හමුදා නිලධාරීන් 21 ක් සහ පොලිස් නිලධාරීන් එක් අයෙකු ද ඊට අයත් වූයේය. රටෙහි පැවති ආරක්ෂක තත්වය මත ත්‍රිවිධ හමුදා ඒකාබද්ධ පුහුණුවක අවශ්‍යතාව දැනී තිබුණු බැවින්, මාණ්ඩලික විද්‍යාලය විසින් ත්‍රිවිධ හමුදාවන් හට ඒකාබද්ධ න්‍යායාත්මකව හා ප්‍රායෝගික අභ්‍යාස ලබාදීම සඳහා පියවර ගන්නා ලදි. තවද, ඒකාබද්ධ යුද පුහුණු පරිසරයක් ඇති කිරීමෙහිලා යුද න්‍යාය හා දර්ශනයන් නැවත සංස්කරණය කර අදට ගැලපෙන ඒකාබද්ධ පුහුණු පාඨමාලාවක් සකස් කිරීමට පෙළඹුනි.

4. වර්ෂ 2007 ක්වූ ජනවාරි මස 22 වන දින, ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවන්ගේ වැදගත් සංධිස්ථානයක් විය. ලෝකයේ වෙනත් රටවල මෙන් ත්‍රිවිධ හමුදාවන්ට න්‍යායාත්මක සහ ප්‍රායෝගික පුහුණුවක් ලබාදීම සඳහා එකම ස්ථානයක් ස්ථාපිත කරනු වස්, මාණ්ඩලික විද්‍යාලය සුවිශේෂ ස්ථානයකට පත්කරන ලදි. අණ හා මාණ්ඩලික විද්‍යාලය නමින් ස්ථාපිත මෙම විද්‍යාලය ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග මහතා විසින් නිල වශයෙන් **ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය** ලෙස (ආසේඅමාවි) ස්ථාපිත කරන ලදි. ඊට සමගාමීව යුද හමුදා නිලධාරීන් 36 දෙනෙකුගෙන් ද. නාවික හමුදා නිලධාරීන් 8 දෙනෙක් සහ ගුවන් හමුදා නිලධාරීන් 10 දෙනෙකුගෙන් ද සමන්විත ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය පළමුවන පාඨමාලාව මෙදින ලියාපදිංචි කර ආරම්භ කරන ලදි. පසුව වර්ෂ 2008 අංක 05 දරන රාජ්‍ය ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාල පනත යනුවෙන් හඳුන්වනු

ලබන පනත අනුව 2008 පෙබරවාරි මස 22 වන දින ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.



2007 ජනවාරි මස 22 දින ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය විවෘත කිරීම



පැරණි ලාංඡනය



නව ලාංඡනය

"සිහිනුවණින් රණ දෙරණට"

5. ග්‍රීක ඉතිහාසයේ සඳහන් පරිදි ආතර් රජුගේ පුරාවෘත්තවල පැවත එන පරිදි බස්සා ඥාණය පිළිබිඹු කරන පක්ෂියා වශයෙන් හැඳින්වේ. මධ්‍ය යුගයේ එකල විසූ පූජ්‍ය පක්ෂය සහ විද්වතුන්ගේ දැනුම, බුද්ධිය හා පරිනතභාවය පෙන්වන සලකුණක් වූ බස්සා සංකේතාත්මකව භාවිතා කර ඇත.

6. රෝම පුරාවෘත්තයන්හි සඳහන් පරිදි යුද්ධයට සහ ප්‍රඥාවට අධිපති ලෙස මිනර්වා දෙවඟන හඳුන්වයි. ඇගේ ප්‍රියතම පක්ෂියා සහ වාහනය වී ඇත්තේද බස්සාය. බස්සා ප්‍රඥාවේ සලකුණ ලෙස සලකමින් එම පක්ෂියා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ සලකුණ ලෙස සම්මත කරගෙන ඇත. "සිහිනුවණින් රණ දෙරණට" යන පාඨය පෙරටුකර ගෙන යුද, නාවික හා ගුවන් හමුදා නියෝජනය කිරීම සඳහා තැඹිලි වර්ණ පසුතලයක කඩු දෙකකින් ද තද නිල් පාට පසුබිමක නැංගුරමකින් ද ලා නිල් පාට පසුබිමක ඇල්බට්‍රොස් පක්ෂියාද සමන්විතව එම ත්‍රිත්වය මධ්‍යයේ බස්සා සලකුණු කොට ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විදුහලේ නිල ලාංඡනය පිළියෙල වී ඇත.

<u>දැක්ම</u>

7. නෝරාගත් ත්‍රිවිධ හමුදා නිලධාරීන් සහ රාජ්‍ය ආයතනවල නිලධාරීන්ගේ වෘත්තීය අවබෝධය දියුණු කිරීම හා යුද හමුදා නිලධාරීන් මේජර්/ ලුතිතන් කර්නල් නිලයේ තනතුරු සඳහාත්. නාවික හමුදා නිලධාරීන් ලුතිතන් කොමාන්ඩර්/ කොමාන්ඩර් තනතුරු සඳහාත්. ගුවන් හමුදා නිලධාරීන් බලඇණි නායක/ වින්ග් කොමාන්ඩර් තනතුරු සඳහාත් වෙනත් රාජ්‍ය ආයතනවල නිලධාරීන් ඔවුන්ට උචිත මාණ්ඩලික තනතුරු හා පොලිස් නිලධාරීන් තම ආයතනවල අණ හා මාණ්ඩලික තනතුරු සඳහා පුහුණු කිරීමද විදුහලේ දැක්ම වේ.

මෙහෙවර

8. ත්‍රිවිධ හමුදාවෙන් තෝරාගත් නිලධාරීන් හට මාණ්ඩලික නිලධාරී දෙවන ශ්‍රේණියේ හා ඊට ඉහළ තනතුරුවල රාජකාරීන් සාර්ථකව ඉටුකරනු වස් අවශ්‍ය දැනුම ලබාදීමටත් ඔවුන් තුල පෞද්ගලික හා වෘත්තීමය සදාචාරාත්මක සංවර්ධනයක් ඇති කිරීමටත් අණ සහ මාණ්ඩලික පත්වීම් වල ඵලදායී ලෙස කටයුතු කිරීම සඳහා හැකියාව ලබාදීම මෙහෙවර වේ.

අරමුණු.

9. මූලික අරමුණු පහත සඳහන් පරිදි වේ.

අ. යුධ හා සාමකාමී යන අවස්ථාවන් දෙකෙහිදීම ක්‍රියාකළ යුතු ආකාරය හා ඊට අදාල ශිල්පීය ක්‍රම පිළිබඳව දැනුවත් වී සිටීම.

ආ. ඕනෑම අන්දමක යුධමය මෙහෙයුමකදී හමුදාවක අන්තර්ගත වී ඇති යුධ මූලධර්ම හා ශිල්පීය ක්‍රම පිළිබඳ දැනුවත් වීම හා ඒ තුලින් පොදුවේ ඒකාබද්ධව ක්‍රියා කිරීම.

ඇ. යුධ හමුදා සේනාංකයක හෝ නාවික හා ගුවන් හමුදාවල ඊට සමාන මට්ටමේ අණදීමේ යාන්ත්‍රණයේ ක්‍රියාකාරකම් පිළිබඳ විශ්ලේෂනාත්මක දැනුම.


ඈ. ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදාවන්හි භූමිකාව, ව්‍යුහය, සංවර්ධනය සහ අන්තර් සබඳතා පිළිබඳව දැනුවත් වීම.

ඉ. ශ්‍රී ලංකාවේ ආරක්ෂක ප්‍රතිපත්තිය සකස් වී ඇති ආකාරය සහ හමුදා දර්ශනය ඊට සම්බන්ධවී ඇති අයුරු අවබෝධ කර ගැනීම.

ඊ. ශ්‍රී ලංකාවේ හා මිත්‍ර රටවල ආරක්ෂක ප්‍රතිපත්තිවලට බලපෑම් ඇති කරනු ලබන ජාතික හා ජාත්‍යන්තර කරුණු පිළිබඳව විග්‍රහය.

මාණ්ඩලික විද්‍යාලයේ ක්‍රියාකාරකම් හා සංවිධාන ව්‍යුහය

10. සංවිධානය. ආසේඅමාවි සංවිධාන ව්‍යුහය - MOD/CSCB/4/(73) 24 February 2010 දරණ ලිපිය යටතේ ආරක්ෂක අමාත්‍යංශය මගින් අනුමත කර ඇත.


සේනාවිධායක
නියෝජ්‍ය සේනාවිධායක
විධායක අධිකාරි
සම්බන්ධිකරණ අංශය
යුහ අංශය
නාවික අංශය
ගුවන් අංශය
උපදේශක පුහුණු
උපදේශක පංතිකාමර
උපදේශක පුහුණු
උපදේශක පංතිකාමර
ප්‍ර ශාඛාව
පාලන සහ භකාස ශාඛාව
අධ්‍යයන අංශය
උපදේශක පුහුණු
උපදේශක පංතිකාමර
ඉංග්‍රීසි අංශය
සම්බන්ධිකරණ අංශය
ප්‍රධාන ඝනකාධිකාරි
සිවිල් සම්බන්ධිකරණ නිලධාරි
අභ්‍යන්තර විගණන
මුදල් අංශය
අක්මුදල් අංශය
විද්‍යාල පොලිස් අංශය
ඉංජිනේරු සේවා අංශය
ලිපිද්‍රව්‍ය වෙළෙඳසල
වෛද්‍ය අංශය
ගෘහස්ථ ක්‍රීඩාගාරය
භට නිවාස නිලධාරි අංශය
නිවස්නය
බති/සැර නිවස්නය
කොනොති සමාජ ශාලාව
ප්‍රවාහන අංශය
උපර්ජන අංශය
සුභසාධක වෙළෙඳසල
උපකරණ නිලධාරි අංශය
භට නිවාස අංශය
භූමි නඩත්තු අංශය
ප්‍රවාහන කණ්ඩය
ලිපි බෙදාහැරීම අංශය
සැහැල්ලු වාහන අංශය
මිලදී ගැනීම් කැඳවීම් අංශය
ලෙජර් අංශය
ලැබීම් පොල
වෘත්තීය යාකිරීම්
කරණවැම් අංශය
රජක සේවා අංශය
ගබඩා අංශය
සලාක අංශය
සන්නාලි අංශය
හොරණෑ /තලා අංශය
පුහුණු සම්බන්ධිකරණ අංශය
පුහුණු ආධාරක අංශය
නොරතුරු තාක්ෂණ ඒකකය
අභ්‍යන්තර ආරක්ෂක කණ්ඩය
ගෘහස්ථ ක්‍රීඩාගාරය
ආයුධාගාරය
පුස්තකාලය
ක්ෂේත්‍ර ආධාරක අංශය
ලිපි ද්‍රව්‍ය වෙළෙඳසල
ප්‍රකාශණ කණ්ඩය
ජායා පිටපත් අංශය
සැලසුම් අංශය
සිතියම් හා ලිපි ද්‍රව්‍ය අංශය
නොරතුරු තාක්ෂණ අංශය
සංනිවේදන අංශය

11. **<u>කාර්ය භාරය</u>.** මාණ්ඩලික විදුහලේ අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා එයට පැවරී ඇති කාර්ය භාරය පහත පරිදි වේ.

අ. සන්නද්ධ හමුදා වල නිලධාරීන් මාණ්ඩලික විද්‍යාලයේ අධ්‍යාපන පාඨමාලාව සඳහා බඳවා ගැනීම.

ආ. පොලිස් දෙපාර්තමේන්තුව හෝ ශ්‍රී ලංකාවෙන් පිටත හමුදාමය සංවිධානවල සාමාජිකයින් විද්‍යාලීය පාඨමාලාව හැදෑරීම සඳහා ඇතුලත් කර ගැනීම.

ඇ. විද්‍යාලයේ අධ්‍යයන මණ්ඩලය තීරණය කරන පරිදි ආරක්ෂාව සහ යුධ කළමණාකරණය පිළිබඳව හැදෑරීම සඳහා රාජ්‍ය නිලධාරීන් හට මුදල් ගෙවා පාඨමාලා හැදෑරීමට අවස්ථාව ලබා දීම.

ඈ. ඉහත 'අ' 'ආ' සහ 'ඇ' ඡේදවල සඳහන් පරිදි එම නිලධාරීන් ලබාගත් කුසලතාවය සහ ප්‍රවීනතාව ඇගයීම සඳහා විභාග පැවැත්වීම.

12. **<u>කළමණාකරණ මණ්ඩලය</u>.** මාණ්ඩලික විද්‍යාලයේ කළමණාකරණ සහ පරිපාලන කටයුතු සඳහා පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත කළමණාකරණ මණ්ඩලයට බලය පැවරී ඇති අතර, එම මණ්ඩලය ආරක්ෂක අමාත්‍යතුමා විසින් පත්කර ඇත.

අ. ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්.
ආ. ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි.
ඇ. යුධ හමුදාපති.
ඈ. නාවික හමුදාපති.
ඉ. ගුවන් හමුදාපති.
ඊ. ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම්
උ. කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ උපකුලපති.
ඌ. භාණ්ඩාගාර ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයෙකු.
එ. ආසේඅමාවි සේනාවිධායක.
ඒ. ආසේඅමාවි බ්‍රිගේඩියර් සම්බන්ධීකරණ - මණ්ඩල ලේකම්.

13. කළමණාකරණ මණ්ඩල රැස්වීම විද්‍යාලයේ පාඨමාලාවේ ගුණාත්මක බවින් ඉහළ නැංවීම සඳහා සහ විදුහලේ යටිතල පහසුකම් නැංවීම අරමුණු කොට ගෙන කළමනාකරණ මණ්ඩලය රැස්වේ. 2020 වර්ෂයේ කළමනාකරණ මණ්ඩල රැස්වීම් තුනක් පවත්වනු ලැබිය.

14. **<u>විද්‍යාලීය අධ්‍යයන මණ්ඩලය</u>.** විද්‍යාලයේ අධ්‍යයන කටයුතු සම්බන්ධව ක්‍රියා කිරීම සඳහා පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත වන අධ්‍යයන මණ්ඩලය පත්කර ඇත.

අ. ආසේඅමාවි සේනාවිධායක – සභාපති.
ආ. කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ උපකුලපතිගේ නියෝජිතයකු.
ඇ. ආසේඅමාවි බ්‍රිගේඩියර් සම්බන්ධීකරණ.
ඈ. යුද හමුදා ප්‍රධාන උපදේශක.
ඉ. නාවික හමුදාවේ ප්‍රධාන උපදේශක.
ඊ. ගුවන් හමුදාවේ ප්‍රධාන උපදේශක.
උ. ආසේඅමාවි ප්‍රධාන මාණ්ඩලික නිලධාරි 1 - ලේකම්.

15. **<u>විද්‍යාලීය විගණන හා කළමනාකරණ කමිටුව</u>.** විද්‍යාලයේ ගිණුම් හා මූල්‍යමය කළමණාකරණ කටයුතු සම්බන්ධව මෙන්ම අනෙකුත් කටයුතු පිළිබඳව සිදු කරන ලද විගණන කටයුතු පිළිබඳව සමාලෝචනය කිරීම සඳහා පහත සඳහන් කමිටුව පත්කර ඇත.

අ. අතිරේක ලේකම් ආරක්ෂක අමාත්‍යාංශය.
ආ. ආසේඅමාවි සේනාවිධායක.

ඇ. මහා භාණ්ඩාගාරය නියෝජනය කරන නිලධාරියෙකු/නිලධාරිණියක.
ඈ. විගණන අධිකාරි - විගණකාධිපති දෙපාර්තුමේන්තුව.
ඉ. ප්‍රධාන අභ්‍යන්තර විගණක - ආරක්ෂක අමාත්‍යාංශය.
ඊ. බ්‍රිගේඩියර් සම්බන්ධීකරණ - ආසේඅමාවි.
උ. කර්නල් පාලන හා භකාස - ආසේඅමාවි.
ඌ. ගණකාධිකාරි - ආසේඅමාවි.
එ. අභ්‍යන්තර විගණක - ආසේඅමාවි.

<u>විෂය නිර්දේශය</u>.

16. පාඨමාලාව මාස **3** ක ආරම්භක වාරයකින් ද, අධ්‍යයන වාර 4 කින් ද සමන්විත වේ.

17. **<u>පළමුවන වාරය - මූලික අධ්‍යයනය (සති 13)</u>**. මෙය 2020 ජනවාරි 06 දින ආරම්භ කරන ලද අතර 2020 අප්‍රේල් 11 දින නිමවිය. පහත සඳහන් විෂයන් පළමුවන අධ්‍යයන වාරය තුළ ආවරණය කරන ලදි:

අ. ත්‍රිවිධ හමුදාවන් හි විවිධ අංශ.
ආ. සංග්‍රාමික සේවා ආධාර.
ඇ. අණ දීම අණ දීමේ සහය සහ තීරණ ගැනීම.
ඈ. යුධෝපාය, ක්‍රියාන්විත හා සටන්.
ඉ. බුද්ධි හා මාණ්ඩලික රාජකාරි.
ඊ. ප්‍රධාන හා භට කාර්ය සම්පාදන මාණ්ඩලික රාජකාරි.
උ. භට කාර්ය සම්පාදන මාණ්ඩලික රාජකාරි.
ඌ. යුද ක්‍රියාන්විත අධියරයන්.
එ. පර්යේෂණ ක්‍රමවේදයන්.
ඒ. ශ්‍රී ලාංකීය අධ්‍යයන.

18. **<u>දෙවන වාරය - යුද ක්‍රියාන්විතයන් (සති 16)</u>**. මෙය 2020 අප්‍රේල් 17 සිට 2020 ජූලි මස 31 දින දක්වා පැවැත්විය. මෙම වාරය තුළ ආවරණයවූ විෂය කොටස් මෙසේයි:

අ. ගුවන් සටන් ක්‍රම.
ආ. ජාත්‍යන්තර සම්බන්ධතා.
ඇ. සිවිල් අධිකාරීන් වෙත හමුදා ආධාර.
ඈ. යුද ක්‍රියාන්විත අධියරයන්.
ඉ. උපක්‍රමික අධ්‍යයන.

19. **<u>තුන්වන වාරය - යුධ කටයුතුවලට අමතර ක්‍රියාන්විත (සති 11)</u>**. මෙම වාරය 2020 අගෝස්තු 05 සිට 2020 ඔක්තෝබර් 15 දක්වා පැවැත් වූ අතර, පහත සඳහන් විෂය කොටස් මේ යටතේ ආවරණය කරන ලදි:

අ. ජාත්‍යන්තර මානව නීතිය පිළිබඳව හැඳින්වීම.
ආ. ජාත්‍යන්තර සම්බන්ධතා.
ඇ. ඒකාබද්ධ මෙහෙයුම්.
ඈ. කළමනාකරණය.
ඉ. නාවික සටන් ක්‍රම.
ඊ. ප්‍රති ත්‍රස්තවාදී ක්‍රියාන්විත මෙහෙයුම්.
උ. විදේශ අධ්‍යාපන චාරිකාව.
ඌ. උපක්‍රමික අධ්‍යයන.

20. **<u>හතරවන වාරය - කළමණාකරණය හා තාක්ෂණය (සති 7)</u>**. මෙම වාරය 2020 ඔක්තෝබර් 28 සිට 2020 දෙසැම්බර් 11 දින දක්වා පැවැත්විය. පහත සඳහන් විෂයන් මෙහිදී ආවරණය කරන ලදි.

අ. කළමණාකරණය.
ආ. යුද තාක්ෂණය.
ඇ. එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම්.
ඈ. ක්‍රියාන්විත සඳහා පුහුණු විම්.
ඉ. ආරක්ෂාව.
ඊ. පරිපාලන අධ්‍යයන.
උ. න්‍යෂ්ටික, ජීව විද්‍යාත්මක හා රසායනික යුද කටයුතු.

ආසේඅමාවි පාඨමාලා අංක 14 ක්‍රියාත්මක විම.

21. ආසේඅමාවි පාඨමාලා අංක 14 හැදෑරූ ශිෂ්‍ය නිලධාරීන් සංඛ්‍යාව පහත පරිදි වේ.

යුද හමුදා	නාවික හමුදා	ගුවන් හමුදා	විදෙස් හමුදා	සිවිල්	මුළු එකතුව
81	24	27	18	–	150

වගුව - 1

22. පාඨමාලාව හැදෑරූ විදේශ ශිෂ්‍ය නිලධාරීන් පහත සඳහන් පරිදි වේ:

අ.	බංගලාදේශය	-	**03**
ආ	ඉන්දුනිසියාව	-	**01**
ඇ.	මාලදිවයින	-	**01**
ඈ	නේපාලය	-	**02**
ඉ.	පකිස්ථානය	-	**02**
ඊ.	රුවන්ඩාව	-	**01**
උ.	චීනය	-	**03**
ඌ.	ඉන්දියාව	-	**02**
එ.	සූඩානය	-	**01**
ඒ.	ඕමානය	-	**01**
ඔ	සෞදි අරාබිය	-	**01**

23. **<u>ප්‍රතිඵල</u>**. ආසේඅමාවි පාඨමාලා අංක 14 ට අදාළ ප්‍රතිඵල නිකුත් කෙරුණු අතර එහි සාරාංශය පහත සඳහන් පරිදි වේ:

අ:අ	අංශය	ශිෂ්‍ය සංඛ්‍යාව	සාමාර්ථය ලබා ගත් සංඛ්‍යාව	අසමත් සංඛ්‍යාව	තම ඒකකය වෙත හරවා යැවූ සංඛ්‍යාව	ආරක්ෂක අධ්‍යයන පිළිබඳ පශ්චාත් උපාධිය සඳහා සුදුසුකම් ලබාගත් සංඛ්‍යාව
(අ)	(ආ)	(ඇ)	(ඈ)	(ඉ)	(ඊ)	(උ)
1	යුද හමුදාව	81	81	-	-	**65**
2	නාවික හමුදාව	24	24	-	-	**23**
3	ගුවන් හමුදාව	27	27	-	-	**26**
4	විදේශ	18	18	-	-	**13**
5	එකතුව	**150**	**150**	-	-	**127**

වගුව - 2

24. ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ පාඨමාලාව අංක 14, අනුමත අධ්‍යයන විෂය නිර්දේශය අනුව මෙහෙයවන ලදී. ත්‍රිවිධ හමුදා උපදේශක නිලධාරීන් හා සුදුසුකම් ලත් කථිකාචාර්යවරුන් විසින් පාඨමාලාව මෙහෙවන ලදී. ආරක්ෂක සේවා පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාවට අදාළ අධ්‍යයන වැඩසටහන සඳහා සුදුසුකම් ලත් විද්‍යාර්ථීන් විසින් දේශන පවත්වන ලදී. මීට අමතරව ශිෂ්‍ය නිලධාරීන්ගේ දැනුම් නිම්වලලු පුළුල් කරනු වස් ඔවුන්ව විවිධ වැදගත් රාජ්‍ය හා පෞද්ගලික ආයතන වෙත සහ විදෙස් සංචාර සඳහා ද සහභාගි කරවන ලදී.

25. ආසේඅමාවි පාඨමාලා අංක 14 අධ්‍යයන වාර 4 කින් සමන්විත වූ අතර එය පහත සඳහන් පුහුණු ක්‍රියාකාරකම්වලින් සමන්විත වන ලදී.

අ. **<u>පුහුණු ක්‍රියාකාරකම් (පළමුවන වාරයේදී පවත්වන ලද අභ්‍යාස).</u>**

(1) **<u>යුද හමුදා පුහුණු අංශය</u>**.

(අ) **'<u>තන්ඩර් බොල්ට්' අභ්‍යාසය</u>**. මෙම අභ්‍යාසය 2020 ජනවාරි මස 17 වන දින විද්‍යාල භූමියේදී පවත්වන ලද අතර, බළඇණි ප්‍රහාරයකදී ආධාරක වෙඩි බලය සැලසුම්කරණය පිළිබඳ අවබෝධයක් ශිෂ්‍ය නිලධාරීන් හට ලබාදෙන ලදී.



(ආ) **'<u>හෝල්ඩ් ෆාස්ට්' අභ්‍යාසය</u>**. මෙම අභ්‍යාසය 2019 ජනවාරි 20 දින යුද හමුදා ශිෂ්‍ය නිලධාරීන් හට විද්‍යාල පරිශ්‍රයේදී පවත්වන ලද අතර, මෙහි අරමුණ වූයේ ආරක්ෂක ක්‍රියාන්විතයන්හිදී ඉංජිනේරු ආධාර, සේනාංක/ බලසේනා මට්ටමින් සැලසුම්කරණය පිළිබඳව අවබෝධයක් ශිෂ්‍ය නිලධාරීන් හට ලබා දීමයි.



(ඇ) **'<u>මාස්ටර් රයිටර්' අභ්‍යාසය</u>**. මෙම අභ්‍යාසය 2020 ජනවාරි 22 දින යුද හමුදා ශිෂ්‍ය නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලද අතර, එමගින් විවිධ රාජකාරී සේවා ලිපි ලිවීම සබැඳිව ඇති නීති සහ ක්‍රමවේදයන් පිළිබඳ නිවැරදි හා මනා පුහුණුවක් ඔවුනට ලබා දෙන ලදී.



(ඇ) **<u>'ටැක්ටිකල් නොටේෂන්' අභ්‍යාසය.</u>** මෙම අභ්‍යාසයේ අරමුණ වන්නේ ක්‍රියාන්විතයකදී ක්‍රියාන්විත මැදිරියක් තුල රාජකාරි කරනු ලබන මාණ්ඩලික නිලධාරියෙකු විසින් හදිසියේ ඇතිවන තත්වයක් අධ්‍යනය කොට තම අණදෙන්නා හට එම තත්වය පිළිබඳ ක්‍රියාන්විත වාර්තාවක් සකස් කොට ඉදිරිපත් කිරීම සඳැදිව පෙරහුරුවක් ලබාදීමයි. මෙම අභ්‍යාසය **2020** ජනවාරි **29** වන දින යුද හමුදා ශිෂ්‍ය නිලධාරින් ගේ සහභාගිත්වයෙන් විද්‍යාල පරිශ්‍රයේදී පවත්වන ලදී.



(ඉ) **<u>'කැරවෑන්' අභ්‍යාසය.</u>** මෙම අභ්‍යාසය මගින් ශිෂ්‍ය නිලධාරින් හට උපක්‍රමශීලිව ක්‍රියාන්විතයන්ට පෙර හමුදාමය වාහන ගමන් ගැනීම සහ වාහන රැලි සම්බන්ධ මාණ්ඩලික කටයුතු හා සැලසුම්කරණය පිළිබඳ දැනුම ලබාදීම අරමුණ විය. මෙම අභ්‍යාසය **2020** පෙබරවාරි **07** දින යුද හමුදා ශිෂ්‍ය නිලධාරින් විසින් විද්‍යාල පරිශ්‍රයේදී පවත්වන ලදී.



(ඊ) **'<u>පැන්ඩෝරා බොක්ස්' අභ්‍යාසය</u>.** මෙම අභ්‍යාසයේ අරමුණ වන්නේ සංක්ෂිප්ත වාර්තාවක් පිළියෙල කිරීම පිළිබඳව දැනුම ලබාදීම හා පෙර පුහුණු සිදු කිරීමයි. මෙම අභ්‍යාසය **2020** පෙබරවාරි **20** වන දින යුධ හමුදා ශිෂ්‍ය නිලධාරින් හට විද්‍යාලය පරිශ්‍රයේදී පවත්වන ලදී.



(2) **<u>නාවික හමුදා පුහුණු අංශය.</u>**

(අ) **<u>'රවුන්ඩ් රොබින්' අභ්‍යාසය.</u>** මෙම අභ්‍යාසය **2020** ජනවාරි **09** දින නාවික හමුදා ශිෂ්‍ය නිලධාරින් සඳහා විද්‍යාල පරිශ්‍රයේදී පැවැත්විණ. මෙම අභ්‍යාශයේ අරමුණ වූයේ ශිෂ්‍ය නිලධාරින්ගේ සිතීමේ සහ තීරණ ගැනීමේ ශක්තිය, ආත්ම විශ්සවාසය, නායකත්ව ගුණාංග හා හැකියාවන් වර්ධනය

කිරීමත් මහජනතාව ඉදිරියේ ආත්ම විශ්වාසයෙන් යුතුව නායකයෙකු වශයෙන් කතාකිරීමේ හැකියාව වර්ධනය කිරීමයි.



(ආ) **'<u>වර්බල් ඩී' අභ්‍යාසය</u>.** මෙම අභ්‍යාසය 2020 ජනවාරි මස 17 වන දින විද්‍යාල භූමියේදී නාවික හමුදා නිලධාරීන් විසින් පවත්වන ලදී. මෙහිදී ශිෂ්‍ය නිලධාරීන් හට කථා පැවැත්වීමේ අභ්‍යාසය සිදු කරන ලදී. මෙහිදී විෂයට අදාල කථා පැවැත්වීම තුලින් ඔවුන්ට තමන්ගේ මතකයන් හා විෂය දැනුම සහාභවක් තුලදී පැහැදිලිව ඉදිරිපත් කිරීමේ කුසලතාව වර්ධනය කිරීම අරමුණු කර මෙම අභ්‍යාසය පවත්වන ලදී.



(ඇ) **'<u>කිලර් වේල්' අභ්‍යාසය</u>.** මෙම අභ්‍යාසය 2020 ජනවාරි මස 25 වන දින විද්‍යාල පරිශ්‍රයේදී නාවික හමුදා ශිෂ්‍ය නිලධාරීන් විසින් පවත්වන ලදී. මෙහිදී ලබාදී ඇති විෂය පථයක් තුල කරුණු ගොණුකර තිරණ ගෙන නිර්දේශ ඉදිරිපත් කිරීම වේ. එම ගොණුකරගත් කරුණු ශිෂ්‍ය නිලධාරීන් විසින් ලිඛිතව හා වාචිකව ඉදිරිපත් කිරීමක් සිදු කරනු ලබයි. මෙහිදී ශිෂ්‍ය නිලධාරීන්ගේ විෂය පථයක් තුල කරුණු ගොණු කිරීමේ හැකියාව සහ ඉදිරිපත් කිරීමේ කුසලතාවයන් වර්ධනය කිරීම අරමුණ වේ.



(3) <u>ගුවන් හමුදා පුහුණු අංශය</u>.

(අ) **'<u>කෂණික කථා' අභ්‍යාසය</u>.** මෙම අභ්‍යාසය 2020 ජනවාරි මස 13 දින ගුවන් හමුදා ශිෂ්‍ය නිලධාරීන් සඳහා විද්‍යාලයේදී පැවැත්විනි. කෂණිකව දෙන ලද

මාතෘකාවක් යටතේ තර්කාන්විතව සහ අර්ථාන්විතව කෙටි කාලයක් තුළ කථා කිරීමට පුහුණුවක් ලබාදීම මෙහි අරමුණ විය.



(ආ) **'<u>විද්වත් කථා'. අභ්‍යාසය</u>.** මෙය 2020 ජනවාරි මස 27 සහ 29 දිනයන්හී දක්වා ගුවන් හමුදා ශිෂ්‍ය නිලධාරින් වෙනුවෙන් විද්‍යාල භූමියේදී පවත්වන ලද අතර. ඔවුන් හට ලබාදෙන යම් මාතෘකාවක් යටතේ සැලසුම් සහගතව නිවැරදිව ඉදිරිපත් කිරීමේ හැකියාව වර්ධනය කිරීම මෙහි අරමුණ විය.



(ඇ) **'<u>සුතාසියා' අභ්‍යාසය</u>.** මෙම අභ්‍යාසය 2020 පෙබරවාරි මස 26 දින සිට 2019 පෙබරවාරි මස 29 වන දින දක්වා ගුවන් හමුදා ශිෂ්‍ය නිලධාරින් උදෙසා විද්‍යාල පරිශ්‍රයේදී පවත්වන ලදී. මෙම අභ්‍යාසය සිදුකරනු ලැබුවේ තනි පුද්ගල අභ්‍යාස පුහුණු කිරීමේ අභිප්‍රාය ඇතිවය. එහිදී යම් මාතෘකාවක් යටතේ නිවැරදිව විස්තර ගොණුකර එය සාර්ථකව ඉදිරිපත් කිරීමේ හැකියාව වර්ධනය කිරීම අරමුණ විය.



(ඇ) **'<u>තන්ඩර් ස්ට්‍රයික්' අභ්‍යාසය</u>.** මෙම අභ්‍යාසය 2020 මාර්තු මස 02 වන දින සහ 04 වන දින දක්වා ගුවන් ශිෂ්‍ය නිලධාරින් සඳහා පැවතුන අතර එහි අරමුණ වූයේ ශිෂ්‍ය නිලධාරින් විසින් ක්‍රියාන්විතයකට ගුවන් බලය ප්‍රායෝගිකව යෙදවීමේ හැකියාවන් ඔප්නැංවීම සඳහා පුහුණුව ලබාදීමයි.



(ඉ) **<u>'ගුවන් පහර' අභ්‍යාසය</u>**. මෙය 2020 මාර්තු මස 06 සහ 07 දින වලදී ගුවන් හමුදා ශිෂ්‍ය නිලධාරින් උදෙසා විද්‍යාල පරිශ්‍රයේදී පවත්වන ලදී. මෙහිදී ලබාදෙනු ලබන ගුවන් පහර යුද අභ්‍යාසයක් තුලින් සිසුන් තුල පවතින පුද්ගලික දක්ෂතාවයන් තනි තනිවම මැන බැලීම හා පුහුණු කිරීමේ අභ්‍යාසයක් ලෙසින් පවත්වන ලදී.



(4) **<u>ත්‍රිවිධ හමුදා ඒකාබද්ධ අභ්‍යාසය.</u>**

(අ) **<u>'රවුන්ඩ් ටේබල්' අභ්‍යාසය</u>**. මෙම අභ්‍යාසය 2020 පෙබරවාරි මස 13 දින සියලු ශිෂ්‍ය නිලධාරින් උදෙසා විද්‍යාල පරිශ්‍රයේදී පැවැත්විණි. මෙම අභ්‍යාසය මගින් සාකච්ඡා සටහන් ලිවීමේ කුසලතාව වර්ධනය කිරීම අරමුණ විය.



(ආ) **<u>'ටුටෝරියල් එස්ටිමේට්' අභ්‍යාසය</u>**. මෙම අභ්‍යාසය 2020 මාර්තු මස 19 වන දින සිට 2020 මාර්තු මස 26 වන දින දක්වා විද්‍යාල පරිශ්‍රයේදී යුධ හමුදා සහ නාවික හමුදා ශිෂ්‍ය නිලධාරින් සඳහා පවත්වන ලදී. මෙම අභ්‍යාසයේ අරමුණු පහත සඳහන් පරිදි විය:

i. යුධ ක්‍රියාන්විත සඳහා යුධ ඇස්තමේන්තු සකස් කිරීමේදී ඒ සඳහා බුද්ධි තොරතුරු රැස්කිරීම සහ එම බුද්ධි තොරතුරු මත සැලසුම් සූදානම් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ දැනුම ලබාදීම.

ii. බලසේනා මට්ටමේ යුධ අභ්‍යාසයන් සඳහා යුධ ඇස්තමේන්තු පිළියෙල කිරීමේ ශිල්පීය ක්‍රම සහ ඒ පිළිබඳ මාණ්ඩලික දැනුම ලබාදීමත්

එය ප්‍රායෝගිකව භාවිතා කිරීමට අවශ්‍ය පුලුල් අවබෝධයක් ලබාදීමත් වේ.



ආ. **<u>දෙවන වාරයේ පවත්වන ලද අභ්‍යාස</u>**.

(1) **<u>යුද හමුදා පුහුණු අංශය</u>**.

(අ) **<u>'බ්‍රාස් ටැක්' අභ්‍යාසය</u>.** මෙම අභ්‍යාසය ගම්පහ අස්ගිරි රජමහා විහාර ප්‍රදේශයේදී 2020 අප්‍රේල් මස 20 දින සිට 2020 අප්‍රේල් මස 24 දින දක්වා පවත්වන ලදී. මෙහිදී සේනාංක/ බලසේනා මට්ටමේ ආරක්ෂිතව ස්ථානගතවීම පිළිබඳ සැලසුම්කරණය පිළිබඳව පුහුණුව ලබාදීම අරමුණ විය.



(ආ) **<u>'ජයිනින් ආමර්' අභ්‍යාසය</u>.** මෙම අභ්‍යාසය 2020 අප්‍රේල් මස 25 දින විද්‍යාල පරිශ්‍රයේදී යුද හමුදා ශිෂ්‍ය නිලධාරීන් වෙනුවෙන් පවත්වන ලදී. මෙම අභ්‍යාසයේ අරමුණ වූයේ ක්‍රියාන්විත නියෝග සබැඳි අභ්‍යාස සිදු කිරීමය.



(ඇ) **<u>'අපර් කට්' අභ්‍යාසය</u>.** මෙම අභ්‍යාසය 2020 මැයි 09 දින සිට 2020 මැයි 15 දින දක්වා යුද හමුදා ශිෂ්‍ය නිලධාරීන් වෙනුවෙන් නාරම්මල ප්‍රදේශයේ පැවැත්විණී. එහි අරමුණ වූයේ බලසේනා මට්ටමින් ප්‍රහාරාත්මක ක්‍රියාන්විත සැලසුම් පුහුණු කිරීම වේ.



(ඇ). **‘<u>කැරියර් පිජන්’ අභ්‍යාසය</u>**. මෙම අභ්‍යාසය **2020** ජූලි මස **17** වන දින සිට **2020** ජූලි මස **24** වන දින දක්වා විද්‍යාල භූමියේදී ගුවන් හමුදා ශිෂ්‍ය නිලධාරීන් උදෙසා පවත්වන ලදී. මෙහි අරමුණ වූයේ යුද න්‍යාය තුළ සේනාංක මට්ටමේ ප්‍රහාරාත්මක හා ආරක්ෂාකාරී මෙහෙයුම් සමගින් උපක්‍රමික යුද ක්‍රියා පිළිබඳ දැනුමක් ලබා දීමයි.



(2) **<u>නාවික හමුදා පුහුණු අංශය</u>**.

(අ) **‘<u>හාර්ඩ් පන්ච්’ අභ්‍යාසය.</u>** **2020** අප්‍රේල් මස **22** දින සිට **23** දින දක්වා නාවික ශිෂ්‍ය නිලධාරීන් සඳහා මෙම අභ්‍යාසය විද්‍යාල පරිශ්‍රය තුළ පවත්වන ලදී. මෙහි අරමුණ වූයේ නාවික ශිෂ්‍ය නිලධාරීන් හට නාවික ආධාරක වෙඩි බල සැලසුම් හා ඒ සම්බන්ධව යොදාගත හැකි නව ක්‍රමවේදයන් පිළිබඳව දැනුමක් ලබාදීම වේ.



(ආ) **‘<u>යුලයිසිස්’ අභ්‍යාසය.</u>** මෙය **2020** මැයි මස **02** දින සිට මැයි **04** වන දින දක්වා නාවික හමුදා ශිෂ්‍ය නිලධාරීන් වෙනුවෙන් විද්‍යාල පරිශ්‍රයේදී පැවැත් වූ අතර, එහි අරමුණ වූයේ ක්‍රියාන්විත සැලසුම් ක්‍රියාදාමයේදී නාර්කිකත්වයේ වැදගත්කම පිළිබඳ ඔවුන් වෙත අවධාරණය කිරීමයි.



(ඇ) **‘තන්ඩර් ස්ට්‍රයික්’ අභ්‍යාසය.** මෙම අභ්‍යාසය 2020 ජූලි මස 24 දින නාවික හමුදා ශිෂ්‍ය නිලධාරින් සඳහා විද්‍යාල පරිශ්‍රයේදී පැවැත්විණි. මෙම අභ්‍යාසයේ අරමුණ වූයේ නාවික හමුදා ශිෂ්‍ය නිලධාරින්ගේ තාක්ෂණික දියුණුව හා නාවික යුධ උපාය පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීමයි.



(ඇ) **‘කොන්ටිකි’ අභ්‍යාසය.** මෙය 2020 ජූලි මස 18 සිට 22 වන දින දක්වා නාවික හමුදා ශිෂ්‍ය නිලධාරින් වෙනුවෙන් කිතුල්ගල සිට කොස්ගම දක්වා වූ ප්‍රදේශයන්හි කැළණි ගඟ ආශ්‍රිතව පැවැත්වුනි. මෙම අභ්‍යාසය පැවැත්වුයේ ශිෂ්‍ය නිලධාරින් තුළ නායකත්ව කුසලතා වර්ධනය කිරීම සඳහාත් නිර්මාණශීලිත්වය හා වෘත්තීය නිපුණතාව ඇති කරනු වස් ප්‍රායෝගික අභියෝගාත්මක ක්‍රියාකාරකම් හරහා ඔවුන්ගේ ආත්ම ශක්තිය ඉහළ නැංවීමේ අභිප්‍රායෙනි.



(3) ඒකාබද්ධ අභ්‍යාසයන්.

(අ) **‘මක්ටොපස්’ අභ්‍යාසය.** මෙය 2020 මැයි මස 15 වන දින සිට 2020 මැයි මස 17 වන දින දක්වා නාවික හා ගුවන් හමුදා ශිෂ්‍ය නිලධාරින් වෙනුවෙන් විද්‍යාල පරිශ්‍රයේදී පවත්වන ලදී. මෙම අභ්‍යාසයේ අරමුණ වූයේ මුහුදු හා ගුවන් ක්‍රියාන්විතයන් සැලසුම්කරණය හා ක්‍රියාවට නැංවීම පිළිබඳ අභ්‍යාසයන් ලබාදීමයි.



(ආ) **‘<u>කොන්ක්‍රීට් ජන්ගල්’ අභ්‍යාසය</u>.** මෙය 2020 මැයි මස 22 දින සිට 2020 මැයි මස 29 දින දක්වා යුද හමුදා හා ගුවන් හමුදා ශිෂ්‍ය නිලධාරීන් වෙනුවෙන් කුරුණෑගල ඇතුගල ප්‍රදේශයේදී පවත්වන ලදී. මෙම අභ්‍යාසයේ අරමුණ වූයේ නාගරික පරිසරයකදී ප්‍රහාරක හා ආරක්ෂාකාරී මෙහෙයුම් බලසේනා මට්ටමින් සැලසුම්කරණය පිළිබඳව අවබෝධය ලබා දීමයි.



(ඇ) **‘<u>ගෝල්ඩන් ශීල්ඩ්’ අභ්‍යාසය</u>.** මෙය 2020 ජුනි 01 දින සිට 2020 ජුනි මස 08 දින දක්වා ත්‍රිවිධ හමුදා නිලධාරීන් වෙනුවෙන් ගලේවෙල, දඹුල්ල හා නාවුල ප්‍රදේශයන්හිදී පවත්වන ලදී. මෙම අභ්‍යාසයේ අරමුණ වූයේ සේනාංක හා බලසේනා මට්ටමේ ආරක්ෂාකාරී මෙහෙයුම්වලදී තීරණ ගැනීමේ හැකියාව සහ ගුවන් බලය යෙදවීම පිළිබඳ පුහුණුවක් ශිෂ්‍ය නිලධාරීන්ට ලබා දීමයි.



(ඈ) **‘<u>ෂැඩෝ ඩාන්ස්’ අභ්‍යාසය</u>.** මෙම අභ්‍යාසය 2020 ජුනි මස 10 දින සිට 2020 ජූලි මස 03 දින දක්වා යුද හමුදා, ගුවන් හමුදා හා නාවික හමුදා ශිෂ්‍ය නිලධාරීන් වෙනුවෙන් විද්‍යාලීය භූමියේදී පවත්වන ලදී. මෙහි අරමුණු වූයේ යුද සැලසුම් පරීක්ෂා කිරීමේ ක්‍රම වේදයක් (War Game) මගින් සැලසුම් තහවුරු කර ගැනීම සහ සේනාංක මට්ටමේ ඒකාබද්ධ මෙහෙයුම් සැලසුම් කිරීම පුහුණු කිරීමයි.



(ඉ) **‘පර්පල් ටර්ටල්’ අභ්‍යාසය**. මෙම අභ්‍යාසය 2020 ජූලි 29 සිට 2020 අගෝස්තු 02 දක්වා කාලය තුළ ත්‍රිවිධ හමුදා ශිෂ්‍ය නිලධාරින්ගේ සහභාගිත්වයෙන් විදුහලේදී පැවැත්විණ. මුහුදේ සහ ගොඩබිම යන උභය මෙහෙයුම් සඳහා පුහුණුවක් ලබාදීම මෙහි අරමුණයි.



ඇ. **තුන්වන වාරයේ පවත්වන ලද අභ්‍යාස**.

(1) **යුද හමුදා පුහුණු අංශය**.

(අ) **‘ඉන්ක් බ්ලොට්’ අභ්‍යාසය**. 2020 සැප්තැම්බර් මස 07 සිට 2020 සැප්තැම්බර් මස 11 දින දක්වා යුද හමුදා ශිෂ්‍ය නිලධාරින් වෙනුවෙන් විද්‍යාල භූමියේදී පවත්වන ලදී. මෙහි අරමුණ වූයේ සේනාංකයක මට්ටමේ ප්‍රතිත්‍රස්ථවාදී ක්‍රියාන්විත සඳහා හට පිරිස් යෙදවීමේ සැලසුම් සකස් කිරීම පිළිබඳව අවබෝධයක් ලබා දීමයි.



(2) **නාවික හමුදා පුහුණු අංශය**.

(අ) **‘සැලමැන්ඩර්’ අභ්‍යාසය**. මෙය 2020 සැප්තැම්බර් මස 22 වන දින සිට සැප්තැම්බර් 23 වන දින දක්වා නාවික ශිෂ්‍ය නිලධාරින් විසින් විදුහල් භූමියේදී සිදු කරන ලද අතර, ශිෂ්‍ය නිලධාරින් හට ඒකාබද්ධ යුද සැලසුම් කිරීම සඳහා පුහුණුවක් ලබාදෙන ලදී.



(ආ) **‘ට්‍රයිඩන්ට්’ අභ්‍යාසය.** මෙය 2020 සැප්තැම්බර් මස 06 දින සිට 09 දින දක්වා නාවික හමුදා ශිෂ්‍ය නිලධාරින් වෙනුවෙන් ත්‍රිකුණාමලය නාවික හමුදා මූලස්ථානයේදී පවත්වන ලදී. මෙහි අභිප්‍රාය වූයේ ක්‍රියාන්විත සැලසුම් පිළිබඳ පුහුණුවක් ලබාදීමයි.



(ඇ) **‘මාර්ලින් ස්පයික් ’ අභ්‍යාසය.** මෙම අභ්‍යාසය 2020 සැප්තැම්බර් මස 26 දින නාවික ශිෂ්‍ය නිලධාරින් සඳහා විද්‍යාල පරිශ්‍රයේදී සිදු කරන ලදී. මෙම අභ්‍යාසය කැරලි/ කෝලාහල වැනි හදිසි ආපදා තත්වයන් හිදී නාවික හමුදාව මුහුදු ක්‍රියාන්විත සිදුකලයුතු ආකාරය සම්බන්ධව ශිෂ්‍ය නිලධාරින්ට අවබෝධයක් ඇතිකිරීම සඳහා විශේෂයෙන් සකසා ඇත.



(ඈ) **‘මැන්ඔප් වෝ’ අභ්‍යාසය.** මෙම අභ්‍යාසය 2020 ඔක්තෝබර් මස 08 වන දින නාවික ශිෂ්‍ය නිලධාරින් සඳහා විද්‍යාල පරිශ්‍රයේදී සිදු කරන ලදී මෙම අභ්‍යාසයේ අරමුණ වූයේ නාවික යුධ මෙහෙයුම් සැලසුම් ක්‍රියාවලිය සඳහා අවශ්‍ය මාණ්ඩලික දැනුම වැඩි දියුණු කිරීමයි.



(ඉ) **'ප්‍රැඩන්ට්' අභ්‍යාසය.** මෙම අභ්‍යාසය 2020 සැප්තැම්බර් මස 26 වන දින නාවික ශිෂ්‍ය නිලධාරින් සඳහා විද්‍යාල පරිශ්‍රයේදී සිදු කරන ලදී. මෙහිදී 2025 වර්ෂය සඳහා වූ නාවික හමුදා උපාය මාර්ග සංකල්පයට සමගාමීව ශිෂ්‍ය නිලධාරින් විසින් අනාගත ශ්‍රීලංකා නාවික හමුදාවට සුදුසු නෞකාවක ගෘංග යෝජනා කිරීම සිදුකරන ලදී.



(3) ගුවන් හමුදා පුහුණු අංශය.

(අ) **'රොක් ඒප්ස්.' අභ්‍යාසය.** මෙම අභ්‍යාසය 2020 සැප්තැම්බර් මස 24 දින සිට 2020 සැප්තැම්බර් මස 27 දින දක්වා කාලය ගුවන් ශිෂ්‍ය නිලධාරින්ගේ සහභාගිත්වයෙන් පැවැත්වුනු අතර ගුවන් හමුදා චීන වරාය කඳවුරට ගොස් එහිදී ද මෙම අභ්‍යාසය ප්‍රායෝගිකව හැදෑරූ අතර, මෙහි අරමුණ වූයේ කඳවුරු ආරක්ෂක විධිවිධානයන් සැලසුම් කිරීම පිළිබඳව න්‍යායාත්මකව හා ප්‍රායෝගික පුහුණුවක් ලබාදීමයි.



(4) ඒකාබද්ධ අභ්‍යාසය.

(අ) **'ස්ලෙජ් හැමර්' අභ්‍යාසය.** මෙම අභ්‍යාසය 2020 සැප්තැම්බර් මස 24 සිට 2020 සැප්තැම්බර් මස 30 දක්වා යුද හා ගුවන් ශිෂ්‍ය නිලධාරින් විසින් ඒකාබද්ධව විදුහලේදී සිදු කරනු ලැබිය. මෙම අභ්‍යාසය මගින් ක්‍රියාන්විත යුද සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමේ පුහුණුව ලබා දෙන අතර, එමගින් පහත සඳහන් අභ්‍යාස/ අධ්‍යයන ලබා දීම සිදු කෙරේ.

i. ක්‍රියාන්විත/උපක්‍රමික මට්ටමේ ප්‍රතිත්‍රස්ත යුද මෙහෙයුම් ක්‍රියා පිළිවෙත් අභ්‍යාස.

ii. ප්‍රතිත්‍රස්ත ක්‍රියා පිළිවෙත් සඳහා ආරක්ෂිත යුද සැලසුම් පිළිබඳව අධ්‍යයනය.

iii. යුද අභ්‍යාස මෙහෙයුම් අභ්‍යාස මගින් අධ්‍යාපනය ලබාදීම.



ඇ. **<u>හතරවන වාරයේදී පවත් වන ලද අභ්‍යාස</u>**.

(1) **<u>යුද හමුදා පුහුණු අංශය</u>**.

(අ) **‘<u>ගයිඩින් ලයිට්’ අභ්‍යාසය</u>**. මෙය 2020 නොවැම්බර් මස 05 දින සිට 2020 නොවැම්බර් මස 06 දක්වා විදුහල් භූමියේදී පවත්වන ලද අතර, යුද හමුදා පුහුණු ප්‍රතිපත්තිවලට අනුව බලසේනා පුහුණු උපදේශකයෙකු ලෙස ක්‍රියා කිරීම සඳහා පුහුණුවක් ලබා දීම මෙම අභ්‍යාසයේ අරමුණ විය.



(ආ) **‘<u>ගෝස්ට් වෝක්’ අභ්‍යාසය</u>**. මෙම අභ්‍යාසය 2020 නොවැම්බර් මස 14 වන දින වැලිවේරිය පුගොඩ සහ කිරිඳිවැල යන ප්‍රදේශයන්හිදී යුද හමුදා ශිෂ්‍ය නිලධාරීන් විසින් සිදු කරන ලදී. යුද ක්‍රමෝපායන් පිළිබඳව හට පිරිස් රහිතව ලිඛිතව බල ඇණී මට්ටමින් සිදු කරනු ලබන යුද අභ්‍යාසයක් වන අතර එය යුද මූලධර්ම මත පිහිටා බලඇණී මට්ටමින් සිදු කරනු ලබන අභ්‍යාසයකි.



(2) **<u>නාවික හමුදා පුහුණු අංශය</u>**.

(අ) **‘<u>සී ලයන්’ අභ්‍යාසය</u>**. 2020 ඔක්තෝබර් මස 23 දින විදුහල් පරිශ්‍රයේදී මෙම අභ්‍යාසය පැවැත් වූ අතර, නාවික ක්‍රියාන්විත පිළිවෙත්වල වර්තමාන හා අනාගත යුද මෙහෙයුම් හි ප්‍රධාන සංකල්ප ප්‍රතිපත්ති හා ගැටලු පිළිබඳව ඉගැන්වීම මෙමගින් බලාපොරොත්තු වේ.



(3) **<u>ඒකාබද්ධ අභ්‍යාස.</u>**

(අ) **<u>'මැග්නම් පෝස්' යුද අභ්‍යාසය</u>**. මෙය 2020 අගෝස්තු මස 28 දින විදුහල් භූමියේදී පවත්වන ලද අතර, මෙය මාණ්ඩලික යුද උපක්‍රමික ක්‍රියාදාමයන්හි මාණ්ඩලික නිලධාරියෙකු නිසි තීරණ ගැනීම සහ විවිධ සැලසුම් ක්‍රියාත්මක කිරීම උදෙසා පුහුණුවක් ලබා දීම අරමුණු කරගෙන සිදු කරන ලදී.



(ආ) **<u>'කෘසිබල්' අභ්‍යාසය</u>**. 2020 නොවැම්බර් මස 09 වන දින සිට 13 වන දින දක්වා ත්‍රිවිධ හමුදා ශිෂ්‍ය නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් විදුහල් භූමියේදී සිදු කරන ලදී. හදිසි මහජන අවශ්‍යතාවන් සහ අභ්‍යන්තර මෙහෙයුම් සඳහා ත්‍රිවිධ හමුදා කැඳවනු ලැබූ විට එම ක්‍රියාවන් සඳහා සැලසුම් කිරීම මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සඳහා ඒකාබද්ධ පුහුණුවක් ලබා දීම මෙහි අරමුණ වේ.



ඉ. **<u>රෙඩ් ඉන්ක් කරෙක්ෂන් (1 වාරය) පරීක්ෂණ</u>**. මෙම පරීක්ෂණ යුද, නාවික සහ ගුවන් හමුදා අංශ යටතේ සිදුකරන ලද අතර මෙහිදී සිදුවන්නේ සෑම අධ්‍යයන වාරයක් තුලම එම වාරය තුල ඉගෙන ගන්නා ලද විෂයපතයට අනුකූලව ලිඛිත සහ පරිගණක ආශ්‍රිත පරීක්ෂණයන් සිදුකිරීම වේ.

(1) **<u>යුද හමුදා පුහුණු අංශය.</u>**

(අ) 'මාස්ටර් රයිටර්2' අභ්‍යාසය 2020 පෙබරවාරි 05 දින පවත්වන ලදී.

(ආ) 'රවුන්ඩ් ටේබල්' අභ්‍යාසය 2020 පෙබරවාරි මස 13 වන දින පවත්වන ලදී.

(2) **<u>නාවික හමුදා පුහුණු අංශය.</u>**

(අ) 'මාස්ටර් රයිටර්' 2 අභ්‍යාසය 2020 පෙබරවාරි මස 05 වන දින පවත්වන ලදි.
(ආ) 'රවුන්ඩ් ටේබල්' අභ්‍යාසය 2020 මාර්තු 13 දින පවත්වන ලදි.
(ඇ) 'අයිඑම්එල්' පරීක්ෂණය 2020 මාර්තු 18 දින පවත්වන ලදි.

(3) **<u>ගුවන් හමුදා පුහුණු අංශය.</u>**

(අ) මාස්ටර් රයිටර් '2' අභ්‍යාසය 2020 පෙබරවාරි මස 05 වන දින දින පවත්වන ලදි.
(ආ) .ලයිටිනින් ස්ට්‍රයික් අභ්‍යාසය 2020 මාර්තු මස 18 සහ 19 යන දිනයන්හිදි පවත්වන ලදි.

ඒ. **<u>රෙඩ් ඉන්ක් කරෙක්ෂන් (2 වාරය) පරීක්ෂණ</u>**.

(1) **<u>යුධ හමුදා පුහුණු අංශය.</u>**

(අ) 'අපර් කට්' අභ්‍යාසය 2020 මැයි 16 දින පවත්වන ලදි.
(ආ) 'ගෝල්ඩන් ෂීල්ඩ්' අභ්‍යාසය 2020 ජුනි මස 10 වන දින පවත්වන ලදි.
(ඇ) 'ෂැඩෝ ඩාන්ස්' අභ්‍යාසය 2020 ජූලි මස 11 වන දින පවත්වන ලදි.

(2) **<u>නාවික හමුදා පුහුණු අංශය.</u>**

(අ) 'ස්මෝක් ස්ට්‍රෑක්' අභ්‍යාසය 2020 අප්‍රේල් මස 25 දින පවත්වන ලදි.
(ආ) 'යුලිසිස්' ක්‍රියාන්විත අභ්‍යාසය 2020 මැයි මස 21 වන දින පවත්වන ලදි.

(3) **<u>ගුවන් හමුදා පුහුණු අංශය.</u>**

(අ) .දඩුමොණරා. අභ්‍යාසය 2020 මැයි මස 05 දින පවත්වන ලදි.
(ආ) .ගෝල්ඩන් ෂීල්ඩ්. අභ්‍යාසය 2020 ජුනි මස 10 වන දින පවත්වන ලදි.
(ඇ) ඩ්‍රැගන් ෆ්ලයි. අභ්‍යාසය 2020 ජූලි මස 17 සහ 18 වන දින පවත්වන ලදි.

ඕ. **<u>රෙඩ් ඉන්ක් කරෙක්ෂන් (3 වාරය) පරීක්ෂණ</u>**.

(1) **<u>යුධ හමුදා පුහුණු අංශය.</u>**

(අ) 'ස්ලෙජ් හැමර්' අභ්‍යාසය 2020 ඔක්තෝබර් මස 02 වන දින පවත්වන ලදි.

(2) **<u>නාවික හමුදා පුහුණු අංශය</u>**.

(අ) 'ට්‍රයිඩන්ට්' අභ්‍යාසය 2020 සැප්තැම්බර් මස 08 දින පවත්වන ලදි.
(ආ) 'මාර්ලින්ස්පයික්' අභ්‍යාසය 2020 ඔක්තෝබර් මස 02 වන දින පවත්වන ලදි.

(3) **<u>ගුවන් හමුදා පුහුණු අංශය</u>**

(අ) 'ඇල්බට්‍රොස්' අභ්‍යාසය 2020 සැප්තැම්බර් මස 07 වන දින පවත්වන ලදි.
(ආ) 'එයාර් ඩිටරන්ස්' අභ්‍යාසය 2020 ඔක්තෝබර් මස 02 වන දින පවත්වන ලදි.

උ෭. **<u>රෙඩ් ඉන්ක් කරෙක්ෂන් (4 වාරය) පරීක්ෂණ</u>.**

(1) **<u>යුධ, නාවික, ගුවන් හමුදා පුහුණු අංශ.</u>**

(අ) 'ගයිඩින් ලයිට්' අභ්‍යාසය 2020 නොවැම්බර් මස 22 දින සිට 25 දින දක්වා පවත්වන ලදී.

(ආ) Viva voice අභ්‍යාසය 2020 නොවැම්බර් මස 24 දින සිට 28 දින දක්වා පවත්වන ලදී.

26. සියලුම ශිෂ්‍ය නිලධාරීන් සඳහා ආරක්ෂක උපාධි පාඨමාලාවේ අධ්‍යයන විෂයන් සඳහා පහත සඳහන් විභාග පවත්වන ලදී.

අ. **<u>දෙවන වාරය</u>.** ශ්‍රී ලාංකික ඉතිහාසය අන්තර් ජාතික කටයුතු විෂය සඳහා විභාගය 2020 අප්‍රේල් මස 20 වන දින සහ ජූනි මස 01 වන දින පවත්වන ලදී.

ආ. **<u>තුන්වන වාරය</u>.** උපාය මාර්ගික අධ්‍යයන විභාගය 2020 සැප්තැම්බර් මස 18 දින පවත්වන ලදී.

ඇ. **<u>හතරවන වාරය.</u>** කළමණාකරණ අධ්‍යයන විභාගය 2020 ඔක්තෝබර් මස 29 වන දින පවත්වන ලදී.

28. **<u>ඉදිරිපත් කිරීම්</u>**. පාඨමාලා අංක 14 ශිෂ්‍ය නිලධාරීන් විසින් පාඨමාලා කාලය තුළදී පහත සඳහන් මාතෘකා යටතේ ඉදිරිපත් කිරීම් සිදු කරන ලදී.

අ. **<u>1 වන වාරය</u>.**

(1) **<u>යුද නායකයන්ගේ නායකත්වය සහ අණදීම පිළිබඳව අධ්‍යයනය කර ඉදිරිපත් කිරීම (යුධ පුහුණු අංශය)</u>**. පහත සඳහන් කීර්තිමත් යුද සෙනෙවිවරුන්ගේ චරිතාපදාන අධ්‍යයනයන් ශිෂ්‍ය නිලධාරීන් විසින් ඉදිරිපත් කරන ලදී.

(අ) ජෙනරාල් ජෝර්ජ් එස් පැටෝන්

(ආ) බෙනිටො මුසෝලිනි

(ඇ) මේජර් ජෙනරාල් ඇරිල් පැරොන්

(ඉ) ජෙනරාල් ජෝර්ජ් සි මාර්ෂල්

(ඊ) ජෙනරාල් මැක්සිම් වේගන්ඩ්

(උ) ෆීල්ඩ් මාර්ෂල් එරික් වොන් පැන්ස්ටෙයින්

(ඌ) නැපෝලියන් බොනපාර්ට්

(එ) ජෝෂප් ස්ටාලින්

(ඒ) ඇඩොල්ෆ් හිට්ලර්

(ඔ) ජෙනරාල් ටොමොයුකි යමාෂිටා

(ඕ) ෆීල්ඩ් මාර්ෂල් විලියම් සිලිම්

(ක) ජෙනරාල් මැතිව් බී රිජ්වේ

(ඛ) ජෙනරාල් ෆර්විස් මුෂ්රාෆ්

(ග) සර් වින්ස්ටන් චර්චිල්

(ඝ) ෆීල්ඩ් මාර්ෂල් කේඑම් කරිඇප්පා

ආ. **<u>දෙවන වාරය</u>**.

(1) **<u>සංග්‍රාම පිළිබඳ අධ්‍යයනයන් ඉදිරිපත් කිරීම යුධ අංශය</u>**. පහත සඳහන් සංග්‍රාම ක්‍රියාන්විත අධ්‍යයනයන් ශිෂ්‍ය නිලධාරින් විසින් ඉදිරිපත් කරන ලදි.

(අ) අයිඒ ඩ්‍රැන්ග් නිම්නයේ සටන (1965 නොවැම්බර්)

(ආ) නෝමන්ඩි ගෙඩබෑම

(ඇ) ඒ1 ඇලමයින් දෙවන සටන

(ඈ) ස්ටාලින්ග්‍රැඩ් සටන (1942 - 1943 පෙබරවාරි)

(ඉ) ජට්ලන්ඩ් සටන (1916)

(ඊ) ඔකිනාවා සටන

(උ) කොසේවෝ යුද්ධයේදී නේටෝ හමුදාව විසින් ගුවන් බලය භාවිතා කිරීම(1999)

(ඌ) මෝල් ක්‍රිකට් ක්‍රියාන්විතය 19 (1982)

(එ) සය දින යුද්ධය (1967 ජූනි 05 - 1967 ජූනි 10)

(ඒ) සෙඩාන් සටන (1040 මැයි)

(ඔ) කොරියන් යුද්ධය (1950 ජූනි 25 - 1991 පෙබරවාරි 28)

(ඕ) පළමු ගල්ෆ් යුද්ධය (1990 අගෝස්තු 02 - 1991 පෙබරවාරි 28)

(ක) ඉන්චොන් ගෙඩබෑම

(ග) බ්‍රිතාන්‍ය සටන (1940)

ඇ. **<u>3 වන වාරය</u>**.

(1) **<u>ඓතිහාසික සිද්ධි පිළිබඳ අධ්‍යයනයන් ඉදිරිපත් කිරීම (ඒකාබද්ධ)</u>**. මෙහිදී පහත සඳහන් මාතෘකා යටතේ අධ්‍යයන කර ඉදිරිපත් කිරීම් සිදු කරන ලදි.

(අ) ඉරාක කැරුල්ල (2003 - 2006)

(ආ) බෘන්ඩි සිවිල් යුද්ධය ((1993 - 2005)

(ඇ) සයිප්‍රස් කැරුල්ල (1954 - 1959)

(ඈ) වියට්නාම යුද්ධය (දෙවන ඉන්දු චීන යුද්ධය 1955 - 1975)

(ඉ) මොල්ඩෝවා හි ට්‍රාන්ස්නිස්ට්‍රියා යුද්ධය (1990 - 1992)

(ඊ) නැගෙනහිර ටිමෝරයේ අර්බුධය (2006)

(උ) එල් සැල්වදෝර් හි ප්‍රති කැරුල්ල (1979 - 1992)ග

(ඌ) ඇල්ජීරියානු විප්ලවය (1954 -1962)

(එ) ඇෆ්ගනිස්ථාන සිවිල් යුද්ධය (1992 -1996)

(ඒ) මොප්ට්‍රාක් මෙහෙයුම.

(ඔ) මලයානු හදිසි මෙහෙයුම (1948 -1960)

(ඕ) නිකරගුවා විප්ලවය (1978 -1990)

(ක) දකුණු ලෙබනනයේ පලස්තීන කැරුල්ල (1968 -1982)

(ග) ක්‍රිස්ටෙරෝ යුද්ධය

(ච) ඉන්දියාවේ මාවෝවාදී කැරුල්ල (1967 සිට වර්ථමානය දක්වා)

(ට) සිරියානු සිවිල් යුද්ධය (2011 සිට වර්ථමානය දක්වා)

(ඩ) ඇංගෝලියානු සිවිල් යුද්ධය (1975 - 2002)

(ත) චීන විප්ලවය (1949)

(ද) ස්පාඤ්ඤ සිවිල් යුද්ධය (1936 - 1939)

(ය) ලිබියානු අර්බුධය (2011 සිට වර්ථමානය දක්වා)

(ස) උගන්ඩාවේ ටෙසෝ කැරැල්ල (1986 - 1993)

ඇ. **4 වන වාරය**

(1) **ශ්‍රී ලංකාවේ සිදුවූ සංග්‍රාම පිළිබඳ ඉදිරිපත් කිරීම්.**

(අ) වැලිමය ආරක්ෂිත මෙහෙයුම (1991).

(ආ) සාම්පුර් ගැටුම (2006).

(ඇ) යාල්දේවි මෙහෙයුම (1995).

(ඈ) ටිවිරැස I මෙහෙයුම (1995).

(ඉ) නොප්පිගල අල්ලා ගැනීම සහ එල්ටිටිඊ සංවිධානයේ පැවැත්මට ඇති බලපෑම.

(ඊ) 1971 ජේවිපි කැරැල්ල.

(උ) මානුෂීය මෙහෙයුමේ අවසන් අධියර විශ්වමඩු වලින් ඔබ්බට.

(ඌ) දරුස්මාන් වර්තාව සහ යතාර්ථය - ශ්‍රී ලංකා ආඛ්‍යානය.

(එ) එල්ටීටියේ තීරනාත්මක හැකියාවන් අඩපන කිරීම සඳහා ක්‍රියාත්මක කල මුහුදු ක්‍රියාන්විත.

(ඒ) මානුෂීය මෙහෙයුමේදී අත්‍යවශ්‍ය සේවාවන් පවත්වාගෙන යාම සඳහා ශ්‍රීලංකා නාවික හමුදාවේ කාර්‍යභාරය.

(ඔ) එල්ටීටිඊ ත්‍රස්ථවාදයට එරෙහිව සාර්ථකත්වයේ සාධක.

(ඕ) මූලතිව් පරාජයේදී ගවන් බලය යෙදවීම හා උගත් පාඩම්.

(ක) මානුෂීය මෙහෙයුමේදී ශ්‍රීලංකා ගුවන් හමුදාවේ කාර්‍යභාරය හා අවසන් ප්‍රතිඵල කෙරෙහි ඇතිකල බලපෑම.

(ග) එල්ටීටිඊයට එරෙහි ගුවන් මෙහෙයුම් එල්ටිටිඊයේ තීරනාත්මක හැකියාව අක්‍රිය කිරීම.

28. **අධ්‍යාපනික වැඩමුළු.** 2020 වර්ෂයේදී ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ මාණ්ඩලික නිලධාරී පාඨමාලා අංක 14 හී ශිෂ්‍ය නිලධාරින් සඳහා පහත සඳහන් අධ්‍යාපන වැඩමුළු පවත්වන ලදී.

අ. **ICRC වැඩමුළුව.** ජාත්‍යන්තර මානුපීය නීතිය පිළිබඳ වැඩමුළුව 2020 මාර්තු මස 10 සිට 12 දින දක්වා විද්‍යාල පරිශ්‍රයේදී පවත්වන ලදී.

ආ. **ඒකාබද්ධ යුධ වැඩමුළුව.** බංගලාදේශ ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ උපදේශක නිලධාරින් කණ්ඩායමක් පැමිණ ඒකාබද්ධ යුධ වැඩමුළුවක් ශිෂ්‍ය නිලධාරින් සඳහා 2020 ජුනී මස 30 වන දින සිට ජූලි මස 02 වන දින දක්වා මෙම විද්‍යාලයේදී පවත්වන ලදී.

ඇ. **යුධ තාක්ෂණික වැඩමුළුව** යුධ තාක්ෂණික වැඩමුළුව 2020 නොවැම්බර් මස 16 සිට 20 දින දක්වා ශිෂ්‍ය නිලධාරින් සඳහා ඉන්දියානු ආරක්ෂක සේවා මාණ්ඩලික විද්‍යාලයේ උපදේශක නිලධාරින් විසින් පවත්වන ලදී.

ඈ. **සයිබර් ආරක්ෂණ වැඩමුළුව.** මෙම වැඩමුළුව ශිෂ්‍ය නිලධාරින් සඳහා 2020 ඔක්තෝබර් මස 22 වන දින මෙම විද්‍යාලයේදී පවත්වන ලදී.

29. **<u>චාරිකා</u>**: වැදගත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන පිළිබඳ ශිෂ්‍ය නිලධාරින්ගේ දැනුම පුළුල් කිරීමේ අරමුණින් සංවිධානය කර තිබූ අධ්‍යයන චාරිකා සහ විදේශ අධ්‍යන සංචාරය කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් පැවැත්වීමට නොහැකි විය.

අ. **<u>1 වන වාරය</u>**

(1) කටුනායක ගුවන් හමුදා කඳවුර වෙත 2020 මාර්තු 13 වන දින ශිෂ්‍ය නිලධාරින් අධ්‍යයන චාරිකාවක යෙදෙන ලදි.



30. **<u>විශේෂ අවස්ථා</u>**.

අ. **<u>මෙම විද්‍යාලය වෙත විදේශ දූත කණ්ඩායම් චාරිකා කිරීම</u>**. පහත සඳහන් විදේශ දූත කණ්ඩායම් 2020 වර්ෂය තුළ ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ චාරිකාවන්හි යෙදෙන ලදි.

(1) ඇමරිකා එක්සත් ජනපදයේ නානාපති ලුතිතන් කර්නල් ට්‍රැවිස් කොක්ස් මහතා 2020 පෙබරවාරි මස 25 වන දින මෙම මාණ්ඩලික විද්‍යාලයේ සංචාරය කරන ලදී.



(2) පකිස්ථාන නානාපති කර්නල් සජාඩ් අලී පිඑස්සි එෆ්එස්සි මහතා 2020 අගෝස්තු මස 24 වන දින මෙම විද්‍යාලයේ සංචාරය කරන ලදී.



ආ. **<u>ජ්‍යෙෂ්ඨ හමුදා නිලධාරින් මෙම විද්‍යාලයේ චාරිකා කිරීම</u>.** පහත සඳහන් ත්‍රිවිධ හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරින් ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයෙහි 2020 වර්ෂයේදී චාරිකාවන්හි යෙදෙන ලදි.

(1) ගුවන් හමුදාධිපති එයාර් මාපල් එස්කේ පතිරන ඩබ්ඩබ්වී ඇන්ඩ් බාර්, ආර්ඩබ්පි ඇන්ඩ් බාර්, ආර්එස්පි බාර්3, විඑස්වි, යූඑස්පි, එම්එස්සි, (එම්ඔඒ) යූඑස්ඒ එම්එස්සි, එන්ඩිසි. පිඑස්සි 2020 දෙසැම්බර් මස 04 දින විද්‍යාලයේ චාරිකාවක යෙදෙන ලදී.



(2) නාවික හමුදාධිපති වයිස් අද්මිරාල් ඩිඑන්එස් උලුගේතැන්න ආර්එස්පි යූඑස්පි එන්ඩිජ පිඑස්සි 2020 දෙසැම්බර් 07 දින විද්‍යාලයේ චාරිකාවක යෙදෙන ලදී.



(3) යුධ හමුදාධිපති ලුතිතන් ජෙනරාල් එල්එච්එස්සි සිල්වා ඩබ්ඩබ්වී ආර්ඩබ්පි විඑස්වි යූඑස්පි එන්ඩිසි පිඑස්සි 2020 දෙසැම්බර් මස 08 වන දින විද්‍යාලයේ චාරිකාවක යෙදෙන ලදී.



31. **<u>විදුහලේ වෙනත් සමාජිය ක්‍රියාකාරකම්</u>**. පහත සඳහන් ක්‍රියාකාරකම් විදුහල තුල 2020 වර්ෂයේදී පැවැත්විනි.

අ. ශිෂ්‍ය නිලධාරින්ගේ වාර්ෂික සුහද චාරිකාව 2020 පෙබරවාරි මස 22 වන දින 'Sense Pavilion Hotel' හිදී පවත්වන ලදී.



ආ. විද්‍යාලීය රාත්‍රී භොජන සංග්‍රහය 2020 සැප්තැම්බර් මස 11 වන දින නිළධාරි නිවස්නයේදී පවත්වන ලදී.



ඇ. 'විද්‍යාලීය වාර්ෂික දිවිමේ තරඟය' 2020 අගෝස්තු මස 04 වන දින නිළධාරින්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.



ඈ. විද්‍යාලීය "හැෂ්රන්" වැඩසටහන 2020 ඔක්තෝබර් මස 01 වන දින නිළධාරින් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.



ඉ. විද්‍යාලීය "ඩයිනස් ක්ලබ්" වැඩසටහන 2020 සැප්තැම්බර් 29 දින නිළධාරින් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.



ඊ. විද්‍යාලය "පැන්ටොමයිම්" වැඩසටහන නිළධාරීන්ගේ රංගන කුසලතා එලි දැක්වීම සඳහා 2020 දෙසැම්බර් මස 04 වන දින විදුහල් භූමියේදී පවත්වන ලදි.



32. <u>ක්‍රීඩා හා විනෝදාත්මක කටයුතු</u> මෙම විද්‍යාලය මගින් ශිෂ්‍ය නිළධාරීන් සඳහා අවශ්‍ය ක්‍රීඩා පහසුකම් ලබාදී ඇති අතර එමගින් ශිෂ්‍ය නිළධාරීන්ගේ කායික හ මානසික ශක්තිය වර්ධනය කර ගනිමින් තම අධ්‍යාපන කටයුතු සංවර්ධනය කර ගැනීමට එමගින් මනා පිටුවහලක් ලැබේ.

අ. ශිෂ්‍ය නිළධාරීන්ගේ අන්තර් කණ්ඩායම් පැසිපන්දු තරගාවලිය 2020 පෙබරවාරි 23 වන දින මෙම විද්‍යාලයේ පැසිපන්දු ක්‍රීඩා පිටියේදී පවත්වන ලදි.



ආ. විද්‍යාලයේ ශිෂ්‍ය නිළධාරීන් සඳහා පවත්වන ලද සැහැල්ලු පන්දු ක්‍රිකට් තරගාවලිය 2020 පෙබරවාරි 15 දින බණිජතෙල් නීතිගත සංස්ථාවේ ක්‍රීඩා පිටියේදී පවත්වන ලදී. මේ සඳහා ශිෂ්‍ය නිළධාරීන්ගේ සහ ස්ථිර කාර්යය මණ්ඩලයේ පවුලේ සාමාජිකයින්ද සහභාගී වූ අතර ක්‍රීඩා හා විනෝදාස්වාදය සඳහා පවත්වන ලදී.



ඇ. විද්‍යලයේ ශාරීරික යෝග්‍යතා මධස්ථානය.



ඈ. විද්‍යාලයේ ටෙනිස් ක්‍රීඩා පහසුකම්.



ඉ. විද්‍යලයේ ස්කොෂ් සහ මේසපන්දු ක්‍රීඩාගාරය.



33. **<u>කාන්තා සමාජය</u>**. විද්‍යාලිය කාන්තා සමාජයේ 2020 වර්ෂය සඳහා සමාරම්භක උත්සවය 2020 ජනවාරි 14 දින සියලුම නිලධාරීන්ගේ භාර්යාවන්ගේ සහභාගීත්වයෙන් ආරම්භ විය. එකිනෙකාගේ දැනුම බෙදා ගැනීම සහ ත්‍රිවිධ හමුදා නිලධාරී භාර්යාවන් අතර සුහදත්වය වර්ධනය උදෙසා මෙම කාන්තා සමාජය පැවැත්විය.



34. **<u>උපාධි ප්‍රධානෝත්සවය</u>**. ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ පාඨමාලා අංක 14 උපාධි ප්‍රධානෝත්සවය 2020 දෙසැම්බර් 11 දින නෙළුම් පොකුණ මහින්ද රාජපක්ෂ රංග ශාලාවේදි පැවැත්විණි. මෙම අත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් ආරක්ෂක ලේකම් තුමා සහභාගී වූ අතර , ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි, ත්‍රිවිධ හමුදාධිපතිවරු සහ තවත් විශේෂිත ආරාධිත අමුත්තන් මේ

සඳහා සහභාගි විය. ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාල පාඨමාලා අංක 14 හි ත්‍යාග හිමිකරගත් ජයග්‍රාහකයින් පහත සඳහන් පරිදි වේ.



අ. පාඨමාලාවේ ප්‍රථම ස්ථානය ලබාගත් යුධ හමුදා ශිෂ්‍ය නිලධාරියා ආරක්ෂක ලෙකම් තුමා වෙතින් සම්මාන කුසලතා ලබාගැනීම.



ආ. පාඨමාලාවේ හොඳම සේනාවිධායක සමීක්ෂණ නිබන්ධනය ඉදිරිපත් කල ශිෂ්‍ය නිලධාරියා ආරක්ෂක ලෙකම් තුමා වෙතින් සම්මාන කුසලතා ලබාගැනීම.



ඇ. බංගලාදේශ යුධ හමුදාවේ ශිෂ්‍ය නිලධාරියෙකු ආරක්ෂක ලෙකම් තුමා වෙතින් සම්මාන කුසලතා ලබාගැනීම.



ඈ. ඉන්දීය නාවික හමුදාවේ ශිෂ්‍ය නිලධාරියෙකු ආරක්ෂක ලෙකම් තුමා වෙතින් සම්මාන කුසලතා ලබාගැනීම.



ඉ. **<u>උපාධි ප්‍රධානෝත්සවයේ රාත්‍රී භෝජන සංග්‍රහය</u>**. 2020 දෙසැම්බර් 12 වන දින උපාධි ප්‍රධානෝත්සවය වෙනුවෙන් පැවැත්වෙන රාත්‍රී භෝජන සංග්‍රහය "EAGLES' LAKESIDE" හිදී පවත්වන ලදී.



<u>පාලන සහ හඳ කාර්ය සම්පාදනය</u>.

35. විද්‍යාලයේ කාර්යක්ෂම පැවැත්ම සඳහා පාලන හා හඳ කාර්ය සම්පාදන අවශ්‍යතා, සියලුම සේවා හා පහසුකම් විදුහල වෙත ඉල්ලීම සහ ලබාදීම පාලන සහ හඳ කාර්ය සම්පාදන ශාඛාවේ ප්‍රධාන කාර්ය වේ. කාර්යක්ෂම ඵලදායී සේවාවක් ලබාදීම සඳහා පහත සඳහන් කණ්ඩායම්/ කණ්ඩ සහ අනුකණ්ඩයන් පාලන සහ හඳ කාර්ය සම්පාදන ශාඛාව යටතේ ක්‍රියාත්මක වේ.

අ. ප්‍රසම්පාදන අංශය.
ආ. ලැබීම් පොළ.
ඇ. ප්‍රවාහන අංශය.
ඈ. නිලධාරි නිවස්තය.
ඉ. ඔනි/සැර නිවාසය.
ඊ. කෝප්‍රල් සමාජ ශාලාව.
උ. සෙසුනිළ භෝජනාගාරය.
ඌ. හට නිවාස කණ්ඩායම්.
එ. ඉංජිනේරු අනු කණ්ඩය.
ඒ. වෛද්‍ය ආධාරක කණ්ඩය.
ඔ. උපකරණ කණ්ඩය.

36. ඉහත කණ්ඩායම්/ කණ්ඩ සහ අනු කණ්ඩයන් මගින් 2020 වර්ෂය තුළදී ක්‍රියාත්මක වූ සේවාවන් පිළිබඳව විස්තර.

අ. **<u>ප්‍රසම්පාදන අංශය.</u>** මෙම අංශය මගින් විදුහලට අවශ්‍ය භාණ්ඩ හා සේවාවන් නියමිත ප්‍රසම්පාදන නිතිරීති අනුව ලබා ගන්නා ලද අතර මේ සියලු කටයුතු මූල්‍ය රෙගුලාසි අනුව සිදු කරන ලදී. 2020 වර්ෂයේ ප්‍රසම්පාදන කටයුතු පහත සඳහන් පරිදි වේ.

(1) ඉංජිනේරු උපකරණ මිලදී ගැනීම.
(2) බැරැක්ක උපකරණ මිලදී ගැනීම.

(3) ජායාස්ථ පිටපත් යන්ත්‍ර/ පරිගණක ශීතකරණ අමතර කොටස් මිලදී ගැනීම.
(4) ප්‍රවාහන අංශය සඳහා අමතර කොටස් මිලදී ගැනීම.
(5) වාහන සේවා සහ අලුත්වැඩියාව.
(6) ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම්.
(7) දේශන ගාස්තු සම්භාෂණ හා සැරසිලි වියදම්.
(8) ක්‍රීඩා භාණ්ඩ මිලදී ගැනීම.
(9) සිසි ටිවි කැමරා පද්ධතිය මිලදී ගැනීම සහා සවිකිරීම.
(10) මුද්‍රණ කටයුතු.
(11) සියළුම ඉදිකිරීම් සඳහා භාණ්ඩ මිලදී ගැනීම.
(12) ශිෂ්‍ය නිලධාරි නේවාසිකාගාර 2 ක් ඉදිකිරීම.
(13) පුස්තකාල ගොඩනැගිල්ලේ දෙවන අධ්‍යයේ ඉදිකිරීම් කටයුතු සිදුකිරීම.

ආ. **<u>ලැබීම් පොළ</u>**. ටෙන්ඩර් මණ්ඩලය විසින් අනුමත කර ගන්නා ලද සියලු භාණ්ඩ නිසි පරිදි ලියාපදිංචි කර ලේඛණ ගත කර ඒ සියලු භාණ්ඩ සේනාවිධායකගේ අනුමැතියකින් පසු භය නිවාස ගබඩාව වෙත නිකුත් කරනු ලැබිය.

ඇ. **<u>ප්‍රවාහන ඛණ්ඩය</u>**.

(1) වාහන සාරාංශය.

යුධ	නාවික	ගුවන්	ආරක්ෂක අමාත්‍යාංශයේ	කුලී පදනම් මත
18	05	04	11	08

වගුව - **3**

(2) ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය සතුව ඇති වාහන පිළිබඳ විස්තරය පහත සඳහන් පරිදි වේ.

(අ) යුධ හමුදාව මගින් ලබාදී ඇති වාහන/ ට්‍රැක්ටර් ටෙලර්.

අංකය	වාහන අංකය	වාහන වර්ගය
(අ)	(ආ)	(ඇ)
1	යුහ 26138	ටොයෝටා කෝස්ටර් බස් රථය
2	යුහ 26141	ටොයෝටා කෝස්ටර් බස් රථය
3	යුහ 23080	ටාටා එස්ඩි 13x13 ට්‍රක් රථය
4	යුහ 4138	ටැපේ ට්‍රැක්ටරය 45 ඩි 1
5	යුහ 18048	ලෑන්ඩ් රෝවර් ඩිෆෙන්ඩර්
6	යුහ 21504	මිට්සුබිෂි එල් 300 වෑන් රථය
7	යුහ 19072	ඉසුසු ඩබල් කැබ් රථය 4x4
8	යුහ 19039	මිට්සුබිෂි එල් 200 ඩබල් කැබ් රථය
9	යුහ 26416	ටොයෝටා ස්ටාර් බස් රථය
10	යුහ 23448	ටාටා ට්‍රක් රථය
11	යුහ 98321	ටොයෝටා හයිලක්ස්
12	යුහ 23439	ටාටා 709
කුලී ගෙවීමේ පදනම් මත යුද හමුදාව වෙත ලබාදී ඇති වාහන		
13	යුහ 50399	ටොයෝටා KDH
14	යුහ 49935	හයිහුන්ඩායි ටක්සන්
15	යුහ 51685	මිට්සුබිෂි කාර් රථය
16	යුහ 51746	ටොයෝටා හයිලක්ස්
17	යුහ 51917	ටොයෝටා හයිලක්ස්
18	යුහ 51408	ටොයෝටා KDH

වගුව -4

(ආ) නාවික හමුදාව මගින් ලබාදි ඇති වාහන.

අංකය	වාහන අංකය	වාහන වර්ගය
(අ)	(ආ)	(ඇ)
1	නාහ 6545	නිශාන් සිවිලියන් බස් රථය
2	නාහ 4858	ප්ලැටිනා ධාවන පැදිය
3	නාහ 7930	හීරෝ හොන්ඩා ධාවන පැදිය
4	නාහ 6053	නිසාන් වෑන් රථය
5	නාහ 3001	ටාටා වින්ගර් වෑන් රථය

වගුව -5

(ඇ) ගුවන් හමුදාව මගින් ලබාදි ඇති වාහන.

අංකය	වාහන අංකය	වාහන වර්ගය
(අ)	(ආ)	(ඇ)
1	ගුවන් 3627	රෝසා බස් රථය (A/C)
2	ගුවන් 3822	ලංකා අශෝක් ලේලන්ඩ් ට්‍රක් රථය
3	ගුවන් 5530	හීරෝ ග්ලැමර් ධාවන පැදිය
4	ගුවන් 6001	ලැන්ඩ් රෝවර් ඩිපෙන්ඩර් රථය

වගුව - 6

(ඇ) ආරක්ෂක අමාත්‍යංශය විසින් සපයා ඇති වාහන.

අංකය	වාහන අංකය	වාහන වර්ගය
(අ)	(ආ)	(ඇ)
1	KF 1966	නිශාන් කාර් රථය
2	KI 9966	ටොයෝටා කාර් රථය
3	CAP 9880	ග්ලෝරි වැන් රථය
4	KW 4345	ටොයෝටා කාර් රථය
5	CAC 8375	ටොයොටා ප්‍රිමියෝ
6	DAF 8294	මහේන්ද්‍රා බොලෙරෝ
7	PE 9641	ටොයෝටා KDH
8	NC 6665	ටොයෝටා වැන් රථය
9	PF 0568	ටොයෝටා වැන් රථය
10	RA 3388	ටැපෙ ට්‍රැක්ටර්
11	RW 8750	ට්‍රැක්ටර් ට්ලෙර්

වගුව -7

(ඉ) කුළී ගෙවීමේ පදනම මත ලබාගත් වාහන.

අංකය	වාහන අංකය	වාහන වර්ගය
(අ)	(ආ)	(ඇ)
1	BEG 1963	හජාජ් පැලැටිනා ධාවන පැදිය
2	BEG 2012	හජාජ් පැලැටිනා ධාවන පැදිය
3	KR 8591	සුසුකි මරුටි කාර් රථය SX4

4	KR 8614	මරුටි සුසුකි කාර් රථය SX4
5	NA 7343	මරුටි සුසුකි කාර් රථය SX4
6	NB 1012	ලංකා අශෝක් ලේලන්ඩ බස් රථය
7	LF 3072	ටාටා ඩබල් බවුසර් රථය
8	RA 8869	මැසී ෆගසන් 240

වගුව - 08

ඈ. **<u>නිලධාරි නිවස්නය</u>.** නිත්‍ය කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 43 දෙනෙකු. දේශීය ශිෂ්‍ය නිලධාරීන් 132 දෙනෙකු උපදේශක නිලධාරීන් 44 දෙනෙකු සහ විදේශීය ශිෂ්‍ය නිලධාරීන් 18 දෙනෙකු සඳහා අවශ්‍ය හෝජනාගාර පහසුකම් 2020 වර්ෂයේදී උසස් අන්දමින් සපයා දෙන ලදී.

ඉ. **<u>බති සැරයන් හෝජනාගාරය</u>.** ත්‍රිවිධ හමුදා බළලත් නිලධාරීන් සහ සැරයන් වරුන් 83 දෙනෙකුගෙන් සමන්විත අතර, ඔවුන්ගේ ප්‍රයෝජනය සඳහා ලබාගන්නා ආහාර සහ නවාතැන් පහසුකම් නිලධාරියෙකුගේ අධික්ෂණය යටතේ ඔවුන් හට සැපයේ.

ඊ. **<u>කොනොනි සමාජ ශාලාව</u>.** ත්‍රිවිධ හමුදා කොනොනින් 282 දෙනෙකුගෙන් සමන්විත මෙම සමාජ ශාලාවේ පහසුකම් හා සෙසු කටයුතු අධීක්ෂණය නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ සිදු කෙරේ.

උ. **<u>සෙසුනිල හෝජනාගාරය.</u>** ත්‍රිවිධ හමුදා සාමාන්‍ය සෙබළුන් 175 දෙනෙකුගෙන් සමන්විත මෙම හෝජනාගාරයේ හෝජනාගාර පහසුකම් හා සෙසු කටයුතු අධීක්ෂණය නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ සිදු කෙරේ.

ඌ. **<u>හඳ නිවාස කණ්ඩය</u>.** මෙම ඛණ්ඩය මගින් විදුහලේ නිවාස හා හඳ නිවාස වල සියළු අලුත්වැඩියා කටයුතු හා නඩත්තු කටයුතු සිදුකිරීම වගකීම වන අතර පුහුණු ආධාරක අංශයේ රාජකාරී සඳහාද දායක වේ. එමෙන්ම පාඨමාලාව සඳහා සහභාගී වන දේශීය හා විදේශීය ශිෂ්‍ය නිලධාරීන්ට සහ නිත්‍ය කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හට අවශ්‍ය නේවාසික පහසුකම් සපුරාදීමට කටයුතු කරනු ලබයි. තවද පාඨමාලාවේ ක්ෂේත්‍ර අභ්‍යාස සඳහා අවශ්‍ය ස්ථාන සකස් කිරීම හා ඒ සඳහා අවශ්‍ය කුඩාරම් සකස් කරදීම වැනි රාජකාරී සිදු කරනු ලබයි.

එ. **<u>ඉංජිනේරු සේවා අනු කණ්ඩය</u>.** විදුහලේ ඉංජිනේරු සේවා අංශයට පහත සඳහන් වගකීම් පැවරේ.

(1) විද්‍යාලයේ ගොඩනැගිලි වලට පහසුකම් සැපයීම හා පුහුණු උපකරණ නිර්මාණය කිරීම හා නඩත්තුව සහ අලුත්වැඩියා කිරීම.
(2) ජලය හා විදුලිය සැපයීම.
(3) පහත සඳහන් ඉදිකිරීම් සහ අලුත්වැඩියා කටයුතු 2020 වර්ෂයේදී සිදුකර ඇත.

(අ) ශිෂ්‍ය නිලධාරී නේවාසිකාගාර 02 ක් ඉදිකිරීම.
(ආ) පුස්තකාල ගොඩනැගිල්ලේ දෙවන අධියර ඉදිකිරීම.
(ඇ) නිලධාරී නිවස්නය සඳහා කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම.
(ඈ) ශිෂ්‍ය නිලධාරීන්ගේ නේවාසිකාගාර අලුත්වැඩියා කටයුතු සිදුකිරීම.
(ඉ) ජල සහ විදුලි පද්ධතිවල අලුත්වැඩියා කටයුතු සිදුකිරීම.
(ඊ) ගොඩනැගිලි වල අමානෝ සෙවිලි තහඩු සඳහා තින්ත අලේප කිරීම.
(උ) ශිෂ්‍ය නිලධාරී නේවාසිකාර අලුත්වැඩියා කටයුතු සිදුකිරීම.
(ඌ) පුහුණු අවශ්‍යතා සඳහා ඇවැසි භාණ්ඩ සහ උපකරණ සකස් කිරීම.
(එ) පාලන අවශ්‍යතා සඳහා ඇවැසි භාණ්ඩ සහ උපකරණ සකස් කිරීම.
(ඒ) වායුසමන යන්ත්‍ර අලුත්වැඩියා කටයුතු සිදුකිරීම.

ඒ. **<u>වෛද්‍ය මධ්‍යස්ථානය</u>.** ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය වෛද්‍ය මධ්‍යස්ථානය දෛනික බාහිර රෝගී ප්‍රතිකාර සේවාවක් සිදු කරන අතර රෝගීන් සඳහා සුලු ප්‍රතිකාර කරනු ලැබේ. වැඩිදුර ප්‍රතිකාර අවශ්‍ය රෝගීන් හමුදා රෝහල් වෙත යොමු කරනු ලැබේ. ත්‍රිවිධ හමුදාව මගින් වෛද්‍ය නිලධාරීන් මාසිකව සේවයේ යොදවන ලදී. 2020 වර්ෂය තුළදී ප්‍රතිකාර ලබා ගත් සංඛ්‍යාව/වාර ගණන පහත සඳහන් පරිදි වේ.

(1) නිළධාරි - 1640
(2) නිළධාරි පවුල්වල සාමාජිකයින් - 118
(3) ත්‍රිවිධ හමුදා සාමාජිකයින් (සෙසුනිළ) - 4205
(4) සිවිල් සේවකයින් - 161
(5) විදේශීය ශිෂ්‍ය නිළධාරින් - 345

ම. **<u>දන්ත වෛද්‍ය සායනය සඳහා.</u>**

(1) නිළධාරි - 196
(2) නිළධාරි පවුල්වල සාමාජිකයින් - 35
(3) සෙසුනිළ - 412
(4) සිවිල් සේවකයින් - 81
(5) විදේශීය ශිෂ්‍ය නිළධාරින් - 15

ඹ. මීට අමතරව විද්‍යාලීය වෛද්‍ය අංශය මගින් පහත සඳහන් සේවාවන්ද ඉටුකර ඇත.

(1) වාර්ෂික සහ වාර අවසාන ශාරීරික යෝග්‍යතා පරීක්ෂණ සිදු කිරීම.
(2) වෛද්‍ය සහ සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන්.
(3) බෝවන රෝග සහ වසංගත රෝග නිවාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
(අ) ඩෙංගු මර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
(ආ) අරක්කැමින් හා භෝජනාගාර සේවකයින් පරීක්ෂාව.
(ඇ) ආසේඅමාවි මාසික වෛද්‍ය පරීක්ෂණ.

37. **<u>සුභසාධක පහසුකම්</u>**. පහත සඳහන් සුභසාධක පහසුකම් මෙම විද්‍යාලයේ ශිෂ්‍ය නිළධාරින්, ඔවුන්ගේ පවුල් වල සාමාජිකයන්, කාර්ය මණ්ඩලය සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් වෙත සපයන ලදි.

අ. ජන අවන්හල පහසුකම්.
ආ. සුභ සාධක හා අවන්හල් පහසුකම් දියුණු කිරීම.
ඇ. සේවයට වාර්ථා කිරීම සඳහා යාමට සහ ඒමට කිරිඔත්ගොඩ සිට විද්‍යාලය දක්වා නොමිලේ බස් සේවාව.

38. **<u>ගණකාධිකාරි කාර්යාලය</u>**. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය විසින් සම්බන්ධීකරණය කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ නිළධාරියෙකු ගණකාධිකාරවරයාගේ තනතුරෙහි රාජකාරි කිරීම සඳහා විද්‍යාලය වෙත ලබා දී තිබුණි. පසුව **2015** ජූලි මස දී ශ්‍රී ලංකා යුද හමුදාවේ ගණකාධිකාරි නිළධාරියෙකු ගණකාධිකාරී තනතුරෙහි වැඩ භාර ගන්නා ලදි.

අ. ගණකාධිකාරි කාර්යාලය වෙතින් ඉටුකරනු ලබන සේවාවන්.

(1) සෑම මුල්‍ය වර්ෂයකම පෙබරවාරි මස **28** දිනට ප්‍රථම මුල්‍ය ප්‍රකාශණ පිළියෙල කිරීම සහ ජාතික විගණන කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම.
(2) වාර්ෂික අයවැය වාර්තා පිළියෙල කිරීම.
(3) සියලුම අදායම් සහ වියදම් නිවැරදිව වර්ගීකරණය කිරීම හා වාර්තා කිරීම.
(4) මාසික බැංකු සැසඳුම් ප්‍රකාශණ පිළියෙල කිරීම.
(5) ගිණුම් පාලන ක්‍රම ස්ථාපනය කර නඩත්තු කිරීම.
(6) රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය, දේශීය අදායම් දෙපාර්තුමේන්තුව වැනි රාජ්‍ය ආයතන සමග සම්බන්ධතාවයෙන් කටයුතු කිරීම.
(7) නිසි පරිදි මුල්‍ය ප්‍රතිපාදන ඉල්ලුම් කිරීම සහ ගෙවීම් කටයුතු සිදු කිරීම.
(8) විද්‍යාලයේ සේවය කරන සිවිල් සේවකයින්ගේ මාසික වේතන සකස් කිරීම හා ගෙවීම් කටයුතු සිදු කිරීම.
(9) විද්‍යාලයේ අවසන් ගිණුම්වලට අදාල ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යාම.
(10) විද්‍යාලයේ අවශ්‍යතාවය පරිදි වෙනත් ගිණුම් කටයුතු ඉටු කිරීම.

ආ. ගණකාධිකාරි කාර්යාලය ගණාකාධිකාරිවරයෙකු සහ කළමණාකාර සහයකයින් තිදෙනෙකුගෙන් සමන්විත වේ.

ඇ. ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ 2020 මූල්‍ය ප්‍රකාශණය කළමණාකරණ මණ්ඩලයේ අනුමැතියෙන් පසු ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති අතර, මෙයට ඇමුණුම 'ආ' වශයෙන් ඇත.

ඈ. 2020 වසරේ වියදම් කර ඇති සියළු වියදම් මුදල් පොත්හි හා නියමිත වැය ශීර්ෂ යටතේ සඳහන් කර ඇත.

39. **<u>සිවිල් පරිපාලන කාර්යාලය</u>**. 2020.12.31 දින වන විට විද්‍යාලය වෙත බඳවා ගන්නා ලද සිවිල් කාර්ය මණ්ඩලය 78 දෙනෙකුගෙන් සමන්විත විය.

අ. සිවිල් පරිපාලන කාර්යාලය මගින් පහත සඳහන් රාජකාරි කරනු ලබයි.

(1) සිවිල් කාර්ය මණ්ඩලයේ දෛනික පාලන හා පරිපාලන කටයුතු සිදු කිරීම.
(අ) පැමිණීමේ හා පිටවීමේ ලේඛණය නඩත්තු කිරීම.
(ආ) නිවාඩු/කෙටි නිවාඩු ලේඛණ පවත්වාගෙන යාම.
(ඇ) රාජකාරි අවශ්‍යතාවය අනුව සිවිල් සේවක මහතුන් රාජකාරි සඳහා අනියුක්ත කිරීම.

(2) සිවිල් කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට අනුමැතිය ලබා ගැනීම, බඳවා ගැනීම සහ බඳවා ගැනීමෙන් අනතුරුව අභ්‍යන්තර අනුයුක්ත කිරීම් සිදු කිරීම.

(3) සිවිල් කාර්ය මණ්ඩලය බඳවා ගැනීමෙන් අනතුරුව රාජ්‍ය බුද්ධි සේවය වෙතින් ආරක්ෂණ නිෂ්කාශණ වාර්තා ලබා ගැනීම.

(4) සිවිල් කාර්ය මණ්ඩලය විශ්‍රාම ගැන්වීම.

(5) සිවිල් කාර්ය මණ්ඩලයේ විනය පවත්වාගෙන යාම සහ අවශ්‍ය අවස්ථාවන්හිදී උපදෙස් ලබාදීම.

(6) විද්‍යාලීය රාජකාරි අවශ්‍යතාවය අනුව සිවිල් කාර්ය මණ්ඩලය රාජකාරියෙහි යෙදවීමට පියවර ගැනීම.

(7) සිවිල් කාර්ය්‍ය මණ්ඩලයට වැටුප් හා දීමනා ලබාදීම.

(8) කඳවුරෙන් පිටත අභ්‍යාසයන් පවත්වන අවස්ථාවලදි ඒ සඳහා රාජකාරියෙහි යෙදවූ සිවිල් සේවක මහතුන් හට ගමන් වියදම් දීමනා හා අතිකාල දීමනා ගෙවීම.

ආ. මෙම කාර්යාලය සිවිල් පරිපාලන නිලධාරියෙකු හා කළමනාකරණ සහකාරවරුන් දෙදෙනෙකුගෙන් සමන්විත වේ.

40. <u>අභ්‍යන්තර විගණන කාර්යාලය</u>.

අ. ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය ස්වාධීන ආයතනයක් බවට පත් වූවාට පසු අභ්‍යන්තර විගණන කාර්යාලයක් ගිණුම් අංශයට පරිබාහිරව පිහිටුවන ලදි. මෙම කාර්යාලය සේනාවිධායක තුමාට හා කළමනාකරණ මණ්ඩලයට වගකීව යුතුවේ.

ආ. අභ්‍යන්තර විගණන කාර්යාලය ගණකාධිවරයකු (අභ්‍යන්තර විගණක) සහ ගිණුම් ලිපිකරුවන් දෙදෙනෙකුගෙන් සමන්විත වේ.

ඇ. අභ්‍යන්තර විගණන කාර්යාලයේ කාර්ය්‍ය භාරය පහත පරිදිය.

(1) වාර්ෂික විගණන වාර්තා පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම.

(2) පවතින විගණන ක්‍රියාදාමය කාලීනව ඇගයීම සහ එහි ඇති දුර්වලතා හා ප්‍රතිඵලදායී ක්‍රියාවන් හඳුනා ගැනීම සහ ඒවාට පිළියම් යෝජනා කිරීම.

(3) විගණන කළමණාකාර කමිටුව කැඳවා, මූල්‍යමය වාර්තා, තොග වාර්තා, සහ අවශ්‍ය ලිපි ලේඛණ පරීක්ෂා කර බලා එහි කරුණු අභ්‍යන්තර විගණන වාර්තාවට ඇතුල් කිරීම.

(4) ව්‍යවස්ථානුකූල නීති රීති වකුලේඛණ හා උපදෙස් මාලා නිසි පරිදි ක්‍රියාත්මක කරනවාදැයි පරීක්ෂාකාරීව සිටීම.

(5) මහා භාණ්ඩාගාරය පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව සඳහා අවශ්‍ය නිර්දේශ හා නිගමන පිළියෙල කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය දත්ත නොරතුරු පිළියෙල කිරීම.

ඇ. 2020 වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 3 ක් පවත්වා ඇති අතර, පැන නැගී තිබූ ගැටලු හදුනාගෙන එමගින් විදුහලේ අභ්‍යන්තර විගණන පාලන ක්‍රමය ශක්තිමත් කිරීමට පියවර ගෙන ඇත. 2020 වාර්ෂික වාර්තාව සඳහා වන අභ්‍යන්තර විගණක නිලධාරීන්ගේ වාර්තාව ඇමුණුම 'ඇ' වශයෙන් ඇත.

<u>නිර්දේශ.</u>

41. ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ අකුණු සන්නායක පද්ධතියක් නොමැති කමින් විද්‍යාලය තුල තිබෙන විද්‍යුත් උපකරණ වලට හානි පැමිණෙන බැවින් අකුණු ආරක්ෂක පද්ධතියක් සවි කිරීම.

42. මෙම විදුහලේ කොම්පත් නොලත් නිලයින් හට තිබෙන නේවාසික පහසුකම් ප්‍රමාණවත් නොමැති බැවින් ඔවුන් හට සිවි මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම.

43. ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ ත්‍රිවිධ හමුදාවට අයත් බළලත් නිලධාරීන්/ සැරයන්වරුන්ගේ දැනට ඇති නේවාසික පසුකම් ප්‍රමානවත් නොවන බැවින් බළලත් නිලධාරීන්/ සැරයන්වරුන් සඳහා තෙමහල් නේවාසික ගොඩනැගිල්ලක් ඉදිකිරීම.

44. මෙම විද්‍යාලයේ අහාර පිසීම සඳහා ඉදිකර ඇති ප්‍රධාන මුළුතැන්ගෙය නවීකරණය කිරීම සිදුකල යුතුව ඇති බැවින් එය සියළු මහසුකම් සහිතව නවීකරනය කිරීම.

45. මෙම විද්‍යාලය වෙත දැනට තිබෙන ගබඩා පහසුකම් ප්‍රමානවත් නොවන බැවින් ගබඩා පහසුකම් සහිත දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම

46. ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ මාණ්ඩලික නිලධාරී පාඨමාලාවන් සඳහා වාර්ෂිකව ශිෂ්‍ය නිලධාරීන් වැඩි ප්‍රමාණයක් සහභාගී කරවීමට කටයුතු සිදුකරන බැවින් ශිෂ්‍ය නිලධාරීන් සඳහා ප්‍රමාණවත් නේවාසික පහසුකම් ලබාදීම වෙනුවෙන් තෙමහල් නෙවාසිකාගාර ගොඩනැගිල්ලක් ඉදිකිරීම.

47. ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයීය පරිපාලනය සඳහා වූ කාර්යාල විවිධ ස්ථානයන්හී තිබෙන බැවින් එම කාර්යාල එක් ස්ථානයක ස්ථාපිත කර පරිපාලනය පහසු කිරීම වෙනුවෙන් මූලස්ථාන ගොඩනැගිල්ලක් ඉදිකිරීම.

48. ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ නිත්‍ය කාර්ය මණ්ඩලයේ නිලධාරීන් හට හා ශිෂ්‍ය නිලධාරීන් හට දැනට තිබෙන ගෘහස්ථ ක්‍රීඩාගාර පහසුකම් ප්‍රමානවත් නොමැති බැවින් නව ගෘහස්ථ ක්‍රීඩාගාරයක් ඉදිකිරීම.

49. මෙම විද්‍යාලයේ සිවිල් කාර්ය මණ්ඩලය සඳහා දැනට තිබෙන නේවාසිකාගාර පහසුකම් ප්‍රමාණවත් නොමැති බැවින් ඔවුන් හට නේවාසිකාගාර ගොඩනැගිල්ලක් ඉදිකිරීම.

<u>සමාලෝචනය.</u>

50. ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාය 2020 වර්ෂයේ කැපී පෙණෙන වර්ධනයක් සහ ප්‍රගතියක් ලබා ගනිමින් විද්‍යාලයේ අරමුණු හා ඉලක්ක කරා ලගාවීමට හැකියාව ලැබී ඇත. 2020 වර්ෂය තුල සැලසුම් කරන ලද අධ්‍යාපන සංවර්ධනයන් කරා ලගාවීමටත් හැකියාව ලැබිණ. 2020 වර්ෂයේ අවසානයේදී සැලසුම් කරන ලද සියළුම සංවර්ධනයන් කරු ලගාවීමටත්හැකියාව ලැබිණ. මීට අමතරව කොවිඩ් 19 වසංගත තත්වය යටතේ සියළුම වෛද්‍ය ක්‍රියා පිලිවෙත් අනුගමනය කරමින් විපය මාලාවට අනුව පාඨමාලාව අවසන් කරන ලදී.

ඇමුණුම අ
වාර්ෂික වාර්තාව - 2020

ගණකාධිකාරිගේ ප්‍රකාශය

1. ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය සිය අභිමානවත් මෙහෙවර සාර්ථකව නිම කළ තවත් වර්ෂයක් වශයෙන් 2020 වර්ෂය හැඳින්විය හැකිය. ජාතික අයවැය මගින් විද්‍යාලය වෙත වෙන් කරන ලද වාර්ෂික ප්‍රතිපාදන ප්‍රමාණය ඉහළ කාර්යක්ෂමතාවයකින් හා වඩාත් ඵලදායී ලෙස විද්‍යාලීය අරමුණු සාක්ෂාත් කර ගැනීමට මෙහෙයවීමෙහිලා ගිණුම් අංශය විශාල දායකත්වයක් දක්වා ඇත.

2. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය මගින් නිකුත් කරනු ලැබූ ශ්‍රී ලංකා ගණකාධිකාර ප්‍රමිතීන් හා ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතීන්ට අදාළව මෙන්ම අනෙකුත් අදාළ වක්‍රලේඛයන් මගින් ලබාදී ඇති මගපෙන්වීම හා උපදෙස් වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නියමිත දිනයන් හිදී ඉදිරිපත් කිරීමට හැකිවී ඇති අතර ඒ මත සිදුකරන ලද විගණන කටයුතුද නියමිත කාල වකවානුව තුලදී අවසන් කිරීමට ඒ නිසා හැකි වී ඇත.

3. එමෙන්ම මූල්‍ය කටයුතු විනිවිධ භාවයකින් මෙන්ම උසස් කාර්යක්ෂමතාවයකින් හැසිරවීම සඳහා අභ්‍යන්තර විගණන අංශය හා එක්ව මනා අභ්‍යන්තර පාලන ක්‍රම හඳුන්වා දීමට හා ඒවා කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ක්‍රියාත්මක විමට ඉඩ සැලසීම තුලින් විද්‍යාලය තුල මනා මූල්‍ය විනයක් ඇති කිරීමට සේනාවිධායකගේ ඇති දර්ශනය සාක්ෂාත් කර ගැනීම සඳහා දායක විමට හැකිවීම සතුටට කරුණකි.

4. පසුගිය වසර හා සසඳන කල මෙහෙයුම් වියදම රු.මි. 145.50 සිට රු.මි. 136.08 දක්වා රු.මි. 9.42 කින් අඩුකර ගැනීමට හැකිවී ඇති අතර මහාභාණ්ඩාගාරය විසින් ලබාදුන් ප්‍රාග්ධන හා පුනරාවර්ථන ප්‍රතිපාදන වඩාත් කාර්‍යක්ෂමව වැයකල අතර, ප්‍රාග්ධන වියදම් සඳහා රු.මි. 33.5 ක ප්‍රතිපාදන ලබා ගැනීමට හැකිවීම තුලින් මෙම විද්‍යාලයේ පැරණී ගොඩනැගිලි බොහොමයක් නවීකරණය කිරීමටද හැකිවිය.

5. එබැවින් 2020 වර්ෂය තුලින් ලබාගත් අත්දැකීම් තුලින් පැවති අඩුපාඩු හා තවදුරටත් අවධානය යොමුකල යුතු අංශ හඳුනා ගනිමින් 2021 වසරද පෙරට වඩා සාර්ථකව වසරක් කිරීමට අරමුණු කර ගනිමු.

එල්ඩිඑස් පෙරේරා
ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය
ගණකාධිකාරි

ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය - සපුගස්කන්ද
2020 වර්ෂය සඳහා මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

		2020 දෙසැම්බර් 31 දිනට	2019 දෙසැම්බර් 31 දිනට
	සටහන්	රු	රු
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල පිරියත සහ උපකරණ	02	1,282,660,648	1,301,512,377
මුළු ජංගම නොවන වත්කම්		**1,282,660,648**	**1,301,512,377**
අස්පෘශ්‍ය වත්කම්			
පරිගණක මෘදුකාංගය		95,000	95,000
ජංගම වත්කම්			
තොගය	03	14,169,908	2,421,216
අත්තිකාරම් සහ පෙර ගෙවීම්	04	485,914	1,020,081
මුදල් හා මුදල් සමාන දෑ	05	38,427,486	8,839,310
ණය		2,528,803	3,229,168
මුළු ජංගම වත්කම්		-	7,192,000
මුළු වත්කම්		**55,612,111**	**22,701,775**
ස්කන්ධය සහ බැරකම්			
සමුච්චිත අරමුදල	06	1,220,397,177	1,233,507,907
තැන්පතු ගිණුම	07	7,562,439	8,575,085
වෙනත් ප්‍රතිපාදන	08	34,681,610	34,681,610
	09	62,703,007	29,225,761
මුළු ස්කන්ධ හා ජංගම නොවන බැරකම්		**1,325,344,233**	**1,305,990,363**
ජංගම වගකීම්			
උපචිත වියදම්	10	11,325	2,305,508
ණය හිමියන්	11	13,012,201	16,013,281
මුළු වගකීම්		**13,023,526**	**18,318,789**
මුළු සමුච්චිත අරමුදල සහ වගකීම්		**1,338,367,759**	**1,324,309,152**

ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ ඉහතින් දක්වා ඇති මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය සහ ඉදිරිපත් කර ඇති මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ ගිණුම්කරණ පොත්වාර්තා සහ අනෙකුත් සියලුම ගිණුම්කරණ තොරතුරු වලට අනුකූලව පිළියෙල කර ඇත.

මූල්‍ය ප්‍රකාශ සඳහා වූ සටහන් මූල්‍ය ප්‍රකාශනයෙහි කොටසක් වේ.

අත්සන් කලේ .....
කමල් ගුණරත්න ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී
ලේකම්
ආරක්ෂක අමාත්‍යාංශය
සාමාජික, කලමණාකරණ මණ්ඩලය
ආයේඅමාවි

අත්සන් කලේ .....
අයිඑච්එම්එන්එන් හේරත් ආරඑස්පී යූඑස්පී
මේජර් ජෙනරල්
සේනාවිධායක
ආයේඅමාවි

අත්සන් කලේ .....
පීආර් පතිරවිතාන
බ්‍රිගේඩියර්
සාමාජික, කලමණාකරණ මණ්ඩලය
ආයේඅමාවි

අත්සන් කලේ .....
එම්ඒඩීපී රණවීර
මේජර්
ගණකාධිකාරි
ආයේඅමාවි

ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය

2020 වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

2020. 12. 31 දිනට		2020	2019
	සටහන්	රු.	රු.
රජයේ ප්‍රදාන	12	*149,031,842*	*152,634,920*
වෙනත් ආදායම්	13	*93,745,021*	*84,699,120*
මුළු ආදායම		***242,776,863***	***237,334,040***
වියදම			
පුද්ගල සංවේතන		*48,740,887*	*47,915,402*
සැපයුම් සහ පාරිභෝගික		*30,214,222*	*33,136,194*
නඩත්තු වියදම්		*6,107,450*	*12,542,925*
ගිවිසුම්ගත සේවාවන්		*51,017,675*	*51,909,471*
මුළු වියදම	14	*136,080,234*	*145,503,992*
ක්ෂයවීම් ගැලපීමට සහ පෙර මෙහෙයුම් අතිරික්තය		*106,696,628*	*91,830,049*
ක්ෂයවීම්			
යන්ත්‍ර පිරියත උපකරණ ඉවත් කිරීමේ අලාභය		-	-
වර්ෂයේ ක්ෂය	15	*(78,733,354)*	*(77,670,657)*
වර්ෂය සඳහා අතිරික්තය/ශුද්ධ ඌණතාවය		***27,963,274***	***14,159,392***

ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය

2020 12.31 න් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

	සමුච්චිත අරමුදල රු.	තැන්පතු ගිණුම රු.	ප්‍රත්‍යාගණන සංචිත ගිණුම	වෙනත් ප්‍රතිපාදන (මූල ධන) රු.
2019 01 01 දිනට ශේෂය	**1,227,265,855**	**4,532,575**	**29,225,761**	**34,681,610**
වර්ෂයේ වැඩිවීම්	498,895	10,475,626		-
වර්ෂයේ අඩුවීම්	(8,416,234)	(6,433,116)		-
ඌනතාවය (වර්ෂය සඳහා ශුද්ධ අලාභය	14,159,391	-		-
2020.01.01 දිනට ශේෂය	**1,233,507,907**	**8,575,085**	**29,225,761**	**34,681,610**
වර්ෂයේ වැඩිවීම්	4,162,358	1,183,336	33,477,246	-
වර්ෂයේ අඩුවීම්	(45,236,362)	(2,195,982)	-	-
ඌනතාවය	27,963,274	-	-	-
2020.12.31 දිනට ශේෂය	**1,220,397,177**	**7,562,439**	**62,703,007**	**34,681,610**

1,325,344,233

මූල්‍ය ප්‍රකාශ සඳහා වූ සටහන් මූල්‍ය ප්‍රකාශනයන්හි කොටසක් වේ.

ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය

2020 වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය	2020 (රු)	2019(රු)
මෙහෙයුම් ක්‍රියාකාරම් වලින් වූ මුදල් ප්‍රවාහය		
ලැබීම්	***138,435,354***	***146,192,028***
රජයේ ප්‍රදාන (පුනරාවර්තන)	*136,875,842*	*140,834,920*
වෙනත් ප්‍රදාන - (පුනරාවර්තන)	*1,559,512*	*5,357,108*
වියදම්	***(136,937,560)***	***(145,940,597)***
පුද්ගල සංවේතන	*(49,324,597)*	*(50,309,649)*
සැපයුම්කරුවන්ට ගෙවීම්	*(23,834,860)*	*(22,542,936)*
නඩත්තු සඳහා වියදම්	*(7,690,085)*	*(14,847,864)*
ගිවිසුම්ගත සේවාවන් සඳහා වියදම්	*(56,088,018)*	*(58,240,148)*
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	***1,497,794***	***251,431***
ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය		
ස්ථාවර වත්කම් අත්පත් කරගැනීම්	*(8,023,038)*	*(15,781,724)*
සංවර්ධන වියදම්	*(6,483,070)*	*(53,183,017)*
තැන්පතු ගිණුමට මාරුකිරීම්		
තැන්පතු ගිණුමෙන් මාරුකිරීම	*(21,347)*	*(182,620)*
ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	***(14,527,455)***	***(69,147,361)***
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය		
රජයේ ප්‍රදාන - (මූලධන)	*33,500,000*	*73,204,000*
වෙනත් ප්‍රදාන - (මූලධන)		
මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	***33,500,000***	***73,204,000***
මුදල් හා මුදල් වලට සමාන දෑ හි සිදු වූ ශුද්ධ වෙනස	***20,470,339***	***4,308,070***
2020.01.01 දින මුදල් හා මුදල් සමාන දෑ	*8,604,419*	*4,296,350*
2020.12.31 දිනට මුදල් හා මුදල් සමාන දෑ	***29,074,758***	***8,604,420***

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශය සඳහා සටහන්

1. **ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ විස්තරාත්මක සටහන්.**

අ. වාර්තාකරනු ලබන ආයතනය.

(1) ආරක්‍ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය, 2008 පෙබරවාරි 19 වන දින සම්මත කරන ලද 2008 අංක 05 දරණ පාර්ලිමේන්තු පනත මගින් 2007 ජනවාරි මස 22 දින ස්ථාපිත කරන ලදී. මෙය එවකට පැවති යුද හමුදා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ අනුප්‍රාප්තිකයායි. යුද හමුදා අණ සහ මාණ්ඩලික විද්‍යාලය 1998 මාර්තු මස 16 වන දින ස්ථාපිත කරන ලද ආයතනයක් වේ.

(2) විද්‍යාලය සපුගස්කන්ද මාකොළ ප්‍රදේශයේ පිහිටා ඇත.

(3) ආරක්පක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය ස්වාධීන ආයතනයක් ලෙස පිළිගෙන මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීමෙන් අනතුරුව ප්‍රථම වරට 2010 දී මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලදී.

ආ. **මූලික කාර්‍යයන්.** විද්‍යාලයේ මූලික කාර්‍යයන් පහත සඳහන් පරිදි වේ.

(1) විද්‍යාලයේ අධ්‍යන පාඨමාලා හැදෑරීම සඳහා ත්‍රිවිධ හමුදා නිලධාරීන්, පොලිස් නිලධාරීන්, රාජ්‍ය අයතනවල නිලධාරීන් හා විදේශ හමුදා නිලධාරීන් ඇතුලත් කර ගැනිම.

(2) ශිෂ්‍ය නිලධාරීන් ඇගයිම සඳහා විභාග පැවැත්වීම.

(3) අධ්‍යන පාඨමාලා සාර්ථකව හැදෑරූ ශිෂ්‍ය නිලධාරීන් වෙත සහතිකපත් නිකුත් කිරීම සහ පීඑස්සී (psc) නිල නාමය ප්‍රධානය කිරීම.

ඇ. **පිළියෙල කිරීමේ පදනම සහ අනුකූලතා ප්‍රකාශය.**

(1) **අනුකූලතා ප්‍රකාශය.** 2018 වර්පය සඳහා මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය 2019 වර්පය සඳහා සවිස්තර ආදායම් ප්‍රකාශය 2019.12.31 දිනෙන් අවසන් වන වර්පය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය 2019 වර්පය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සටහන් වලින් විද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශනය සමන්විත වේ. මෙම මූල්‍ය ප්‍රකාශනය ශ්‍රී ලංකා ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කරන ලද 20120101 දි හෝ එදිනට පසු ආරම්භ වන මූල්‍ය කාලච්ඡේදයන් සඳහා අදාල වන නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් වන LKAS සහ SLFRS යන්ට අනුකූලව පිළියෙල කර ඉදිරිපත් කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශනය ප්‍රථමවරට SLFR - 1 වලට අනුව පිළියෙල කර ඇත.

(2) **මිනුම් දඬු සඳහා පදනම.** මූල්‍ය ප්‍රකාශ හා විද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම යන පදනම මත පිළියෙළ කර ඇති අතර, ගිණුම්කරණ ප්‍රතිපත්ති මුළු කාල පරිච්ඡේදය පුරාවටම ඒකාකාරිව උපයෝගී කර ගෙන ඇත. මූල්‍ය ප්‍රකාශනයන්හි උද්ධමනකාරී බලපෑම් සඳහා ගැලපුම් කර නොමැත.

(3) **භාවිතා කරන සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය.** නව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිති ප්‍රතිපත්ති හා එය විද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශණ පිළියෙල කරන දිනට ක්‍රියාත්මක නොවිය.

ශ්‍රී ලංකා ගිණුම් කරන ආයතන. මුදල් හා සැලසුම් අමාත්‍යාංශයේ සහභාගිත්වය ඇතුව පිළියෙල කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිති 2 වෙළුමට අනුව විද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශනය පිළියෙල කර නොමැත. යථා කාලයේදී පහත සඳහන් ප්‍රමිතින්ට අනුව 2014 ජනවාරි මස 01 දින සිට වාර්ෂිකව අනුගමනය කිරීමට බලාපොරොත්තු වේ.

SLPSAS 5	–	විදේශ විනිමය අනුපාත අනුව වෙනස්වීම්.
SLPSAS 6	–	අදාල වාර්තා දිනට පසු සිදුවීම්.
SLPSAS 7	–	දේපළ,පිරියත සහ උපකරණ.
SLPSAS 8	–	ප්‍රථිපාදන. අසම්භාව්‍ය වගකීම් සහ වත්කම්.
SLPSAS 9	–	තොග.
SLPSAS 10	–	භූවමාරු කටයුතු වලදී ලබන අදායම්.

ඇ. **<u>වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති</u>**.

(1) **<u>දේපල, පිරියත හා උපකරණ</u>**.

(අ) **<u>හඳුනා ගැනීම හා මිනුම් දඩු</u>**.

i. දේපල. පිරියත හා උපකරණ මුල් පිරිවැය හෝ ප්‍රත්‍යාගනක්පන අගයෙන් ක්පයවීම් අඩුකර දක්වා ඇත. 2010 වර්පය ප්‍රථම මූල්‍ය ප්‍රකාශණ පිළියෙල කිරීම සඳහා දේපල පිරියත හා උපකරණ 2009. 12. 31 දිනට ප්‍රත්‍යාගනනය කරන ලදී. වටිනාකමේ තක්සේරුව සුදුසුකම්ලත් පුද්ගලයින් විසින් ඵලදායී ක්පයවීම් අනුපාත හා වෙළඳ වටිනාකම සැලකිල්ලට ගෙන සිදුකර ඇත.

ii. විද්‍යාලයට පැහැදිලි හිමිකමක් නැති දේපල පිරියත හා උපකරණ වල ප්‍රත්‍යාගණනය කර නොමැති අතර, ගිණුම් වලටද ගෙන නැත. කෙසේවෙතත්, රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා යුධ හමුදාව විසින් ලබාදී ඇත. වාහනවල අයිතිය එම ආයතනයන්ට අයත් වුවත්, එහි ප්‍රතිලාභ හා වියදම් විද්‍යාලය සතු බැවින් දේපල, පිරියත හා උපකරණ යටතේ දක්වා ඇත. එම වාහනවල අයිතිය විද්‍යාලය වෙත පවරා ගැනීමට කටයුතු සිදුකරමින් පවතී.

iii. ඉඩම් අත්පත් කර ගැනීම සඳහා ගෙවා ඇති අත්තිකාරම් මූල්‍ය ප්‍රකාශනයන්හි දේපල, පිරියත හා උපකරණ වශයෙන් දක්වා ඇත.

iv. දේපල, පිරියත හා උපකරණ වල පිරිවැයට එය අත්පත් කරගැනීමට හෝ ඉදිකිරීමට අදාල පිරිවැය සහ එම වත්කම් භාවිතා කළහැකි මට්ටමට ගෙන ඒම සඳහා දරණ ලද සියළු වියදම් ඇතුලත්ව ඇත.

v. 2012 මූල්‍ය ප්‍රකාශනයන්හි පරිගණක හා උපාංග වෙන වෙනම අයිතමයන් ලෙස වර්ගීකරණය කර ඇති අතර. ඊට අනුකූලව 2011 12. 31 දිනට දේපල පිරියත හා උපකරණ වල පිරිවැය හා ක්පය කාලය ගලපන ලදී.

(ආ) **<u>ක්ෂයවීම්</u>**.

i. දේපල. පිරියත හා උපකරණ වල පිරිවැය මත පහත සඳහන් ක්ෂය අනුපාතයන් යටතේ ක්ෂය වෙන්කිරීම් කර ඇත.

ගොඩනැගිලි	2%
යන්ත්‍රෝපකරණ	125%
ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ	20%
වාහන	20%
පරිගණක සහ උපකරණ	20%
පුස්තකාල පොත් හා ප්‍රකාශණ	20%

ii. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ක්ෂයවීම් දේපල පිරියත හා උපකරණ වල ඇස්තමේන්තු ගත ආයු කාලය අනුව සරල මාර්ග ක්‍රමය යටතේ ක්ෂයවීම් හඳුනාගෙන ඇත. ඉඩම් සහ කෙරිගෙන යන වැඩ සඳහා ක්පය වීම් ගණනය කර නොමැත. වර්ෂය තුල මිලදිගත් /ඉදිකරන ලද සියළු දේපල, පිරියත හා උපකරණ සඳහා ක්ෂයවීම් වෙන්කර ඇත.

iii. වර්ෂය තුලදි ඉවත් කරන ලද දේපල පිරියත සහ උපකරණ සඳහා ක්ෂයවීම් ගණනය කර නොමැත.

(ඇ) **<u>ඉවත් කිරීම්</u>**.

i. දේපල පිරියත හා උපකරණ ඉවත් කිරීමේදි පැන නගින ලාභ හෝ අලාභ එම අයිතම ඉවත් කරන වර්ෂයේදි විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ඇතුලත් කර ඇත.

ii. ඉවත් කරන ලද දේපල පිරියත හා උපකරණ වල පිරිවැය හා සමුච්චිත ක්ෂය මූල්‍ය ප්‍රකාශන වලින් ඉදිරිපත් කර ඇත.

(2) **<u>රජයේ ප්‍රදාන සඳහා ගිණුම් තැබීම</u>**.

අ. පුනරාවර්ථන ප්‍රදාන මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ආදායම් වශයෙන් සලකා ඇත.

ආ. මූලධන වත්කම් අත්පත් කර ගැනිම් හා වැඩිදියුණු කිරිම වෙනුවෙන් ලබාදෙන ලද මූලධන හා ප්‍රාග්ධන සමුච්චිත අරමුදලට ආදායම් වශයෙන් සලකා ඇති අතර, වත්කම්වල ජීව කාලය තුලදි එම ප්‍රධානයන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයන්ට හඳුනාගනු ලැබේ.

ඇ. රජයෙන්/රජය අනුබද්ධ ආයතන වලින් වර්ෂය තුලදි විද්‍යාලයට ලැබුණු මූල්‍ය නොවන ප්‍රධානයන්හි වටිනාකම වත්කම් හා ප්‍රධාන ලෙස මූල්‍ය ප්‍රකාශනයන්හි දන්වා ඇත.

(3) **<u>මූදල් ප්‍රවාහ ප්‍රකාශය</u>**.

අ. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 20 අනුව සෘජු ක්‍රමය භාවිත කරමින් මූදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර ඇත.

ආ. වර්ෂය තුලදී මූල්‍ය නොවන ප්‍රදාන ලෙස ලැබුණු ප්‍රදානයන් මූදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරිමේදී ඇතුලත් නොකරන ලදී.

(4) **<u>වගකීම් හා වෙන්කිරීම්</u>**. මූල්‍ය ප්‍රකාශය පිළියෙළ කිරිමේදී සියළු හඳුනාගත් වගකිම් ගිණුම්ගත කර ඇත.

(5) **<u>ආදායම් හඳුනාගැනීම</u>**. විද්‍යාලයේ ආදායම් යන්නට පුනරාවර්තන ස්වභාවයේ රජයේ ප්‍රදාන හා අනෙකුත් ප්‍රදාන ඇතුලත් වේ. සියළු ආදායම් හා වියදම් උපචිත පදනම අනුව හඳුනා ගෙන ඇත.

(6) **<u>සේවක ප්‍රතිලාභ</u>**. නිශ්චිත ලද දායකත්ව සැලසුම නිශ්චිත දායකත්ව සැලසුම සඳහා ඇති බැඳිම මූල්‍ය කාර්ය්සාධන ප්‍රකාශයේ වියදමක් ලෙස හඳුනාගෙන ඇත. සිවිල් සේවකයින් ගේ වේතනයෙන් 12% ක් දායකත්වයක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට විද්‍යාලය විසින් සපයනු ලැබේ.

(7) **<u>අනෙකුත් මෙහෙයුම් නොවන වියදම්</u>**. මූල්‍ය කාර්ය්සාධක ප්‍රකාශයේ අතිරික්තය/ ඌනතාවය ගණනය කිරිමේදී විද්‍යාලය පවත්වාගෙන යාම සඳහා වූ සියළු වියදම් මෙන්ම මූලධන වත්කම් නඩත්තු සඳහා වූ වියදම්ද සලකා ඇත.

(8) **<u>සංසන්දනාත්මක තොරතුරු</u>**. සමාලෝචිත වර්ෂයේ ඉදිරිපත්කිරීම් හා සැසඳීම් කලහැකි වන පරිදි සංසන්දනාත්මක සංඛ්‍යාවන් අවශ්‍ය පරිදි ඉදිරිපත් කර ඇත.

(9) **<u>මූල්‍ය තත්ව ප්‍රකාශනයේ දිනට පසු සිදුවීම්</u>**. මූල්‍ය තත්ව ප්‍රකාශයේ දිනට පසුව සිදුවූ ප්‍රමාණාත්මක සිදුවීම් සඳහා අවශ්‍ය පරිදි ගැලපීම් නිසි මූල්‍ය ප්‍රකාශනයන්හි සිදුකර ඇත.

(10) **<u>සම්බන්ධිත පාර්ෂවයන්ගේ ක්‍රියාකාරකම්</u>**.

(අ) ත්‍රිවිධ හමුදාව වෙතින් ආයතන වශයෙන් නිලධාරින් 87 ක් හා සෙසු නිලයන් 610 ක ප්‍රමාණයක් විද්‍යාලය සඳහා අනුයුක්ත කර ඇති අතර, ඔවුන්ගේ වැටුප් හා දීමනා සඳහා වන වියදම් අදාල හමුදාවන් විසින් දරණු ලබයි. 2020 වර්ෂය සඳහා අදාල හමුදාවන් විසින් ගෙවනු ලබන වැටුප් හා දීමනා ප්‍රමාණය පහත පරිදි වේ.

ශ්‍රී ලංකා යුධ හමුදාව	-	රු	**373,144,808.00**
ශ්‍රී ලංකා නාවික හමුදාව	-	රු	**125,565,689.00**
ශ්‍රී ලංකා ගුවන් හමුදාව	-	රු	**109,569,948.00**

(ආ) ශ්‍රී ලංකා ගුවන් හමුදාව හා ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් වාහන 03 ක් විද්‍යාලය වෙත අනුයුක්ත කර ඇති අතර, එම වාහනවල නඩත්තු වියදම් ඔවුන් විසින් දරණු ලැබේ.

සටහන 2: දේපළ, යන්ත්‍ර සහ උපකරණ

විස්තරය	වියදම/වටිනාකම			රු:	
	01012020 දිනට ශේෂය	වර්ෂය තුල නවාංග සහ සංවර්ධනය	ප්‍රත්‍යාගණනය	වර්ෂය තුල හමාර කිරීම	31.12 2020දිනට වටිනාකම
ඉඩම්	105,838,789				105,838,789
ගොඩනැගිලි	1,238,629,088	7,678,451			1,246,307,539
යන්ත්‍ර සූත්‍ර	154,714,989	18,127,513	6,924,306	26,909,306	152,859,502
වාහන	33,465,000			1,050,000	32,415,000
ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ	93,243,314	304,016	20,947,820	31,119,012	83,376,138
පරිගණක සහ අමතර කොටස්	140,317,366	6,107,120	5,605,120	11,314,166	140,715,440
කෙරෙමින් පවතින් වැඩ	-				
පුස්ථකාල පොත්	2,323,809				2,323,809
	1,768,534,354	**32,217,099**		**70,392,484**	**1,763,836,215**

විස්තරය	ක්ෂය				
	01.01.2020 දිනට ශේෂය	වර්ෂය සඳහා		වර්ෂය තුල	31.12 2020දිනට වටිනාකම
ඉඩම්	-	-			-
ගොඩනැගිලි	150,582,778	24,926,151			175,508,929
යන්ත්‍ර සූත්‍ර	106,385,674	15,712,605		21,096,586	101,001,692
වාහන	25,311,000	2,718,000		1,050,000	26,979,000
ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ	75,931,518	13,077,882		31,119,012	57,890,388
පරිගණක සහ අමතර කොටස්	106,951,961	21,833,954		11,314,166	117,471,748
පුස්ථකාල පොත්	1,859,048	464,762			2,323,809
	467,021,978	**78,733,353**		**64,579,764**	**481,175,567**

ලිඛිත වටිනාකම- 31.12.2020	***1,282,660,648***
ලිඛිත වටිනාකම- 01.01.2020	**1,301,512,376**

සටහන 3 : තොගය	*2020*	*2019*
ලිපි ද්‍රව්‍ය	*9,324,080*	*36,259*
වෙනත් ආසේඅමාවි තොග	*666,764*	*312,643*
ගොඩනැගිලි ද්‍රව්‍ය	*3,324,572*	*1,320,560*
යුධ හමුදාව වෙතින් ලැබිම්	*854,492*	*751,755*
ඉන්ධන	*0*	
	14,169,908	***2,421,217***

සටහන 4 : පෙර ගෙවුම්	*2020*	*2019*
ශ්‍රී ලංකා ඉන්පුවරන් - වාහන රක්ෂණ	*53,469*	*20,861*
සේවා ගිවිසුම්	*72,644*	*52,150*
තොරතුරු තාක්ෂණය	*0*	*894,550*
දුරකථන	*334,510*	
උත්සව දීමනා	*3,750*	*48,682*
විශේෂ දීමනා	*21,542*	*3,838*
	485,914	***1,020,081***

සටහන 5 : මූදල් සහ මූදල් හා සමාන දෑ	2020	2019
මූදල් ශේෂය ප්‍රාග්ධන	*27,138,435*	*8,144,543*
මූදල් ශේෂය පුනරාවර්ථන	*1,936,323*	*459,876*
විදේශීය ව්‍යවහාර ගිණුම්	*7,868,830*	*71,638*
මූදල් ශේෂය ණය ගිණුම	*1,483,897*	*163,254*
	38,427,485	***8,839,310***

සටහන 6 : සමුච්චිත අරමූදල	2020	2019
ආරම්භක ශේෂය	*1,233,507,907*	*1,227,265,855*
ගැලපුම්		
ණය හිමියන්	*86,540*	
සමුච්චිත ක්පයවීම		*(4,186,843)*
වත්කම් මාරුකිරීම් හා විනාශ කිරීම	*498,895*	*498,895*
පුස්තකාල පොත් මාරු කිරීම		
පුස්තකාල පොත් ක්පය කිරීම		
උත්සව අත්තිකාරම්	*5,068*	
විශේෂ දීමනා පොලිය ලැබිම්	*(3,008)*	
තැන්පතු ගිණුම	*130,645*	*(255,496)*
	3,940,105	
ගැලපුම් වවිනාකම 20200101 දිනට	***1,237,667,257***	***1,223,322,411***
රජයේ ප්‍රතිපාදන - ප්‍රාග්ධන		
වර්පය සඳහා හිගය	*(45,233,354)*	*(3,973,896)*
	27,963,274	*14,159,391*
වර්පය අවසානයේ ශේෂය	***1,220,397,177***	***1,233,507,907***

සටහන 7 : තැන්පත් ගිණුම	2020	2019
ආරම්භක ශේෂය	*8,575,085*	*4,532,575*
වර්පය තුළ ගෙවිම්	*(1,639,727)*	*(6,241,519)*
තැන්පත් ගිණුමට මාරු කරන ලදි		
පුනරාවර්ථන වියදම් සඳහා මාරු කරන ලදි	*(556,255)*	*(191,597)*
මූල්‍යධන වියදම් සඳහා මාරු කරන ලදි		
තැන්පත් ගිණුමට මාරු කරන ලදි (ජර්නල් ඇතුලත් කිරීම්)	*1,183,336*	*10,475,626*
	7,562,439	***8,575,085***

සටහන 8 : වෙනත් මූලධන	2020	2019
ආරම්භක ශේෂය	*34,681,610*	*34,681,610*
පුද්ගල සංවේතන රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන	-	-
පුද්ගල සංවේතන යුධ හමුදාව වෙතින් ලැබිම්		
2019.12.31 දිනට ශේෂය	***34,681,610***	***34,681,610***

සටහන 9 : එකතුවන වියදම්	*2020*	*2019*
ආරම්භක ශේෂය	*29,225,761*	*29,225,761*
වර්ෂය තුළ වර්ධනය	*33,477,246*	
වර්ෂය තුළ අඩුවීම		
වර්ෂ අවසාන ශේෂවය		
	62,703,007	***29,225,761***

සටහන 10 : එකතුවන වියදම්	*2020*	*2019*
සංනිවේදන	-	*53,585*
විදුලිය	-	*1,756,687*
ජලය	-	*483,035*
කුලි හා බදු මුදල	-	
පුවත්පත්	-	*1*
මුද්දර	*11,325*	*12,200*
	11,325	***2,305,508***

සටහන 11 : අනියම් ණයකරු	*2020*	*2019*
පුද්ගල වේතන	*10,992,853*	*10,992,853*
සැපයුම් හා පරිභෝජන		*624,485*
නඩත්තු සේවා		*913,434*
ගිවිසුම්ගත සේවා	*1,772,678*	*3,213,563*
මූලධන වියදම්	*268,946*	*268,946*
	13,012,201	***16,013,281***

සටහන 12 : රජයේ ප්‍රතිපාදන	*2020*	*2019*
වර්ෂය තුළ අනුමත වෙන්කිරීම් වියදම් (පුනරාවර්තන)	*155,208,000*	*153,100,000*
මුදා නොහරින ද්‍රවශීලි මුදල්	*(6,176,158)*	*(465,080)*
භාණ්ඩාගාරය වෙතින් මුදල් මුදා හැරීම්	***149,031,842***	***152,634,920***

සටහන 13 : වෙනත් ලැබීම්	*2020*	*2019*
ප්‍රාග්ධන පිරිනැමීම් මාරු කලා වෙනස්වන ලැබීම්	*78,733,354*	*77,177,896*
පොලී ලැබීම්	*6,048*	*6,319*
ණය ලැබීම්	*120,277*	*118,063*
අනෙකුත් ලැබීම්	*14,885,342*	*7,396,843*
යුධ හමුදාව වෙතින් ලැබීම්		
	93,745,021	***84,699,121***

සටහන 14 : වියදම්	*2020*	*2019*
පුද්ගල චේතන	***48,740,887***	***47,915,402***
වැටුප් සහ දීමනා	*34,414,009*	*35,271,289*
වෙනත් දීමනා	*12,903,058*	*12,644,113*
	1,423,820	
සැපයුම් හා පරිභෝජන	***30,214,222***	***33,136,194***
ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා	*2,676,879*	*7,894,191*
තෙල් හා ඉන්ධන	*12,156,000*	*11,800,000*
බැරුක්ක භාණ්ඩ	*2,247,785*	*5,070,981*
සංග්‍රහ	*1,887,668*	*1,299,974*
පුවත්පත්	*157,010*	*372,386*
උපාධි ප්‍රධානෝත්සවය	*11,088,880*	*6,698,662*
නඩත්තු වියදම්	***6,107,450***	***12,542,925***
වාහන	*457,691*	*2,991,753*
යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	*1,623,519*	*3,102,667*
ගොඩනැගිලි හා ඉදිකිරීම්	*2,929,365*	*5,194,234*
භූමි නඩත්තුව	*185,576*	*258,522*
තොරතුරු තාක්ෂණය	*911,300*	*966,728*
සන්නිවේදන උපකරණ		*29,020*
ගිවිසුම්ගත සේවා	***51,017,675***	***51,909,471***
සන්නිවේදන	*5,562,580*	*5,656,868*
විදුලිය	*25,722,868*	*25,277,986*
ජලය	*6,148,660*	*6,412,631*
කුලී හා බදු මුදල්	*6,312,334*	*5,229,701*
සනීපාරක්ෂක	*874,303*	*842,236*
දේශණ හා වෙනත්	*4,184,000*	*2,551,000*
රජකහල් සේවා		
වෙනත්	*2,212,931*	*5,939,049*
	136,080,235	***145,503,991***

සටහන 15 : ක්ෂයවීම	*2020*	*2019*
ගොඩනැගිලි	***24,926,151***	***24,772,582***
යන්ත්‍ර සූත්‍ර	*15,712,605*	*15,347,286*
වාහන	*2,718,000*	*2,718,000*
ගෘහ භාණ්ඩ සහ කාර්යාල		
උපකරණ	*13,077,882*	*11,449,714*
පරිගණක සහ අමතර කොටස්	***21,833,954***	***22,918,314***
පුස්ථකාල පොත්	*464,762*	*464,762*
වසර සඳහා ක්ෂය වීම	**78,733,354**	**77,670,657**

ඇමුණුම ඇ
වාර්ෂික වාර්තාව - 2020

2020 වාර්ෂික වාර්තාව සඳහා අභ්‍යන්තර විගණන නිලධාරිගේ ප්‍රකාශය

1. 2020.12.31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය තුළ අභ්‍යන්තර විගණන අරමුණු ඉටු කර ගැනීම සඳහා අභ්‍යන්තර විගණන සැලැස්මක් පිළියෙල කොට ක්‍රියාවට නැංවීම මෙම අභ්‍යන්තර විගණන අංශයෙහි මූලික කාර්යභාරය විය. එහිදී අභ්‍යන්තර පාලනය පද්ධතිය, මුදල් රෙගුලාසිවල අනුකූලව කටයුතු කිරීම, සම්පාදන මාර්ගෝපදේශයන් අනුව ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම, තොග පාලනයල කළමනාකරණ සැලසුම්වල ඵලදායිතාවය සහ අවසන් ගිණුම පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම යනාදී සෑම ක්ෂේත්‍රයක්ම ආවර්ණයවූ පහත කරුණු පිළිබඳව කළමණාකරනයේ අවධානය යොමුකරවන ලද අතර විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වලදීද සාකච්ජාවට භාජනය කරන ලදි.

අ. 2019 වර්ෂයට අදාල මූල්‍ය වාර්තා සමාලෝචනය කිරීම සහ ඉදිරි වර්ෂයේදී වැඩිදියුණු කරගත යුතු ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් උපදෙස් ලබාදීම.

ආ. ගිණුම්කරන පද්ධතියේ ඵලදායිතාවය වර්ධනය කරනු වස් ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කිරීම සඳහා මගපෙන්වීම.

ඇ. ප්‍රසම්පාදන කටයුතුවල පවතින අඩුපාඩු සහ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට අනුව එම අඩුපාඩු නිවැරදි කිරීමේ වැදගත්කම අවධාරණය කිරීම.

ඈ. මහා භාණ්ඩාගාරයෙන් අනුමත කරන ලද ප්‍රතිපාදනයන් මත විද්‍යාලයේ පුනරාවර්තන වියදම් සහ හා ප්‍රාග්ධන වියදම් සමාලෝචනය කිරීම.

ඉ. විද්‍යාලීය ගිණුම්කරණ කටයුතු සහ අනෙකුත් කටයුතුවලදී රජයේ චක්‍රලේඛ සහ මුදල් රෙගුලාසි අනුගමනය කිරීමේ වැදගත්කම.

ඒ. 2020 වර්ෂය සඳහාවූ ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රසම්පාදන සලැස්ම සමාලෝචනය කිරීම සහ ඒ අනුව හඳුනා ගන්නා ලද අඩුපාඩු ඉදිරි වර්ෂය තුළ නිවැරදි කරගැනීමේ වැදගත්කම.

2. ඉහත පෙන්වා දෙන ලද කරුණු පිළිබඳව කළමණාකරණය විසින් අවධානය යොමුකර නිවැරදි කිරීම සිදු කරන ලෙස ඉල්ලා සිටින ලදි.

3. 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් වාර 3 ක් පවත්වා ඇත. ඒ සඳහා නිරීක්ෂකයින් ලෙස ජාතික විගණන කාර්යාලයේ නියෝජිතයින් සහ රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශ අභ්‍යන්තර විගණන අංශයේ නියෝජිතයින්ද සහභාගි වෙමින් එම කාර්යයන් සාර්ථක ලෙස ඉටුකර ගැනීමට අවශ්‍ය සහයෝගය දැක්වූ බවද සතුටින් සිහිපත් කරමි.

සිඑස් හෙට්ටිආරච්චි
අභ්‍යන්තර විගණක


ඇමුණුම ඈ
වාර්ෂික වාර්තාව - 2020

01. **ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ ශිෂ්‍ය නිලධාරින්ගේ පලමු වාරයේ සිට හතරවන වාරය දක්වා අධ්‍යාපන සංවර්ධන හා ප්‍රගතිය**

		පළමු අධ්‍යයන වාරය					දෙවන අධ්‍යයන වාරය				
		>80% අති දක්ෂ	70 - 80% ඉතා හොඳයි	50 - 70% හොඳයි	40 - 50% සාමාන්‍යයි	<40% සාමාන්‍ය පහල	>80% අති දක්ෂ	70 - 80% ඉතා හොඳයි	50 - 70% හොඳයි	40 - 50% සාමාන්‍යයි	<40% සාමාන්‍ය පහල
1.	අණ හා මාණ්ඩලික රාජකාරි පිළිබඳව අධ්‍යන විෂය කටයුතු වල ප්‍රගතිය	3.75%	8.64%	79.66%	7.40%	0.55%	4.94%	18.08%	67.6%	7.75%	1.63%
2.	පශ්චාත් අධ්‍යයන විෂයන් සමත් ප්‍රතිශතය	100%					100%				

		තුන්වන අධ්‍යයන වාරය					හතරවන අධ්‍යයන වාරය				
		>80% අති දක්ෂ	70 - 80% ඉතා හොඳයි	50 - 70% හොඳයි	40 - 50% සාමාන්‍යයි	<40% සාමාන්‍ය පහල	>80% අති දක්ෂ	70 - 80% ඉතා හොඳයි	50 - 70% හොඳයි	40 - 50% සාමාන්‍යයි	<40% සාමාන්‍ය පහල
1.	අණ සහ මාණ්ඩලික රාජකාරි පිළිබඳව අධ්‍යන විෂය කටයුතු වල ප්‍රගතිය	6.67%	33.24%	55.46%	2.64%	1.83%	11.88%	24.17%	57.34%	6.03%	0.53%
2.	පශ්චාත් අධ්‍යයන විෂයන් සමත් ප්‍රතිශතය	99.33%					85.23 %				

පළමු වාරයේ සිට හතරවන වාරය දක්වා සිසුන්ගේ ප්‍රගතිය




කාර්ය සාදක දර්ශකය (Key Performance)

අ/අ **S/No**	කාර්ය සාදක දර්ශකය **(Key Performance Indicator)**	කාර්ය සාදක මිනුම් **(Measurement)**	ලඟාවූ ඉලක්කයන් **(Target/Milestone reached)**
01	අධ්‍යාපනික දශර්කයන් **(Academic Indicator)** අ. ශිෂ්‍ය සහභාගිත්ව දශර්කය :Student Participation Indicator)	අ. ත්‍රිවිධ හමුදා ශිෂ්‍ය සහභාගිත්වය 132 දක්වා වැඩිවිය. ආ. මාණ්ඩලික පාඨමාලාව සමත්වීම ප්‍රතිශතය උපරිමය දක්වා වර්ධනය කිරීම. ඇ. ආරක්ෂක විද්‍යාවේදී (M Def SS) හිමිගැන්වීම ප්‍රතිශතය ක්‍රමික වර්ධනය කිරීම. ඈ. විදේශ ශිෂ්‍ය සහභාගිත්වය ක්‍රමවත්ව වර්ධනය කිරීම.	අ. 2019 වෂර්ය තුල ශිෂ්‍ය සහභාගිත්වය 160 ක් වූ අතර එය 2020 වෂර්යේදි ශිෂ්‍යයින් 150 ක් දක්වා වැඩිවිය. ඈ. 2019 සහ 2020 වෂර් තුල සහභාගි වූ විදේශ ශිෂ්‍යයන් සංඛ්‍යාව 18 ක් විය.

01**ශ** අධ්‍යාපනික දර්ශකයන්
(Academic Indicator)


ශිෂ්‍ය සහභාගිත්ව දශර්කය.

අ. **මාණ්ඩලික පාඨමාලාවට ත්‍රිවිධ හමුදා නිලධාරි සහභාගිවීමේ වර්ධනය**




වර්ෂය

ආ. **මාණ්ඩලික පාඨමාලාව සමත්වීම**.




චාර්පය

ඇ. **ආරක්ෂක විද්‍යාවේදී MSc (Defence Studies) හිමිගැන්වීම**



ඈ. **දේශීය සහ විදේශීය ශිෂ්‍ය සහභාගිත්වය**. 2020 වෂර්යේ දේශීය නිලධාරි සංඛ්‍යා 132 ක් වූ අතර විදේශ ශිෂ්‍ය නිලධාරි සහභාගිත්වය 18 ක් විය.




කායර් සාධක දශර්කයේ සඵලතාවය **(Target Reached for Key Performance Indicators)**

අ/අ S/No	කායර්සාධක දශර්කය (Key Performance Indicator)	කායර්සාධක මිණුම් (Measurement)	ලගාවූ ඉලක්කය (Target/Milestone reached)
01	අ. පරිශීලනය කරනු ලබන පොත්හි ගුණාත්මකව සහ ප්‍රමාණාත්මකව වධර්නය කිරීම ආ. පුහුණුවීම් කටයුතු සඳහා ඉදුරාම ඇවැසි නව උපාංගයන් ප්‍රමාණාත්මකව සහ ගුණාත්මකව වධර්නය කිරීම.	අ. 2019 වෂර්ය තුල පැවති පොත් ප්‍රමාණය 12467 ක් වූ අතර එය 2020 වෂර්ය තුලදී **12949** ක් දක්වා වධර්නය කර ගැනිමට හැකිවිය. සමස්ත පුස්තකාල කටයුතු පරිගණක ජාලගත කරන ලදි. ආ. 2020 වෂර්යේ තුල පුස්ථකාලය සතුව තිබූ විද්‍යුත් ග්‍රන්ත ප්‍රමාණය 2200 ක් දක්වා වධර්නය කර ගැනිමට හැකිවිය.	අ. විද්‍යාලය වෙත පුහුණු කටයුතු සඳහා රු. මිලියන 7.71 ක මුදලක් වියදම් කර ප්‍රගධන භාණ්ඩ මිලදි ගන්නා ලදි. ආ. රු. මිලියන 6.4 ක් වැයකර පුහුණු කටයුතු වෙනුවෙන් පරිගණක සහ වෙනත් උපකරණ මිලදී ගන්නා ලදී.

02. <u>අධ්‍යාපනික සංවධර්න දශර්කය</u>
<u>(Academic Development Indicator)</u>

අ. පුස්තකාල පහසුකම් සංවධර්න වීම.



ඇමණුම ඉ
වාර්ෂික වාර්තාව 2020

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. ඩීඊඒ/ඩීඑස්සීඑස්එස්/1/20/05 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2021 ජූලි 13 දින

සේනාවිධායක
ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය
සපුගස්කන්ද

ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මාණ්ඩලික විද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) හෙයියන්තුඩුව තරුණ සේවා සභාවට අයත් අක්කර 11 ක ඉඩම තුල විද්‍යාලය විසින් ගොඩනැගිලි ඉදිකර ඒවා භාවිතයට ගනිමින් පැවතියද එම ඉඩමෙහි නීත්‍යානුකූල අයිතිය ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 31 වන විටත් පවරාගෙන නොතිබුණි. රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 87(අ) අනුව මෙම හිමිකම සීමාවීම පිළිබඳ මූල්‍ය ප්‍රකාශන තුල හෙලිදරව් කල යුතු වුවද අයිතිය සීමාවීම පිළිබඳ මූල්‍ය ප්‍රකාශන තුල හෙලිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 හි 47 ඡේදය අනුව වත්කම් වසර තුනකට හෝ පහකට වරක් ප්‍රත්‍යාගණනය කල යුතු වුවත් මාණ්ඩලික විද්‍යාලයේ රු.මිලියන 1,352.15 ක් වටිනා ඉඩම් සහ ගොඩනැගිලි විද්‍යාලයේ ආරම්භක වර්ෂය වූ 2008 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ප්‍රත්‍යාගණනය කර වත්කම්වල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. එසේම වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේදී එකම පංතියකට අදාල සියලුම වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම් තුල ගැලපීම් කල යුතු වුවත් ඒ පිළිබඳ නොසලකා පිරිවැය රු.388,277,669 ක වත්කම් අයිතම 2060 ක් 2019 දෙසැම්බර් 30 දින ප්‍රත්‍යාගණනය කර තිබුණු අතර මෙම වත්කම් අයිතම අතරින් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු වත්කම් අයිතම 257 ක ප්‍රත්‍යාගණිත අගය වූ රු.33,477,246 ක අගය පමණක් මූල්‍ය ප්‍රකාශනවල ගලපා තිබුණි. එසේම මෙකී වත්කම් ප්‍රත්‍යාගණනය සම්බන්ධව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 7 හි සඳහන් නියමයන්ට අනුව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමක් සිදුකර නොතිබුණි.

(ඇ) යුධ හමුදාව විසින් මාණ්ඩලික විද්‍යාලයට ලබාදී තිබුණු රු.1,375,000 ක් වටිනාකම සහිත ලැන්ඩ ක්‍රෘසර් ජීප් රථය 2020 ඔක්තෝබර් 14 දින යුධ හමුදාව වෙත නැවත භාරදී ඇතත් එම ජීප් රථයේ වටිනාකම වාහන ගිණුමෙන් හා සමුච්චිත ක්ෂය ගිණුමෙන් ඉවත් කර නොතිබුණි. ඒ අනුව විද්‍යාලයේ වාහන වටිනාකම රු.1,375,000 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ඈ) 2020 දෙසැම්බර් 16 දින විද්‍යාලය වෙත ලැබී තිබුණු රු.1,246,900 ක් වටිනා පරිගණක හා උපාංග ගිණුම්ගතකර එයට අදාල ක්ෂය ගැලපීම්ද සමග මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

(ඉ) ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාල රු.2, 506,916 ක වියදම් උපචිත වියදම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයට අදාල විද්‍යාලයේ පුනරාවර්තන වියදම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් සහ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන මාණ්ඩලික විද්‍යාලයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මාණ්ඩලික විද්‍යාලයේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මාණ්ඩලික විද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මාණ්ඩලික විද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මාණ්ඩලික විද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මාණ්ඩලික විද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මාණ්ඩලික විද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතා සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මාණ්ඩලික විද්‍යාලය පවත්වා ගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාණ්ඩලික විද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (I) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාණ්ඩලික විද්‍යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මාණ්ඩලික විද්‍යාලය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනුයාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ මාණ්ඩලික විද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ) රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අංක PF/FD/04/198 හා 2016 ජනවාරි 05 දිනැති ලිපිය	මාණ්ඩලික විද්‍යාලයේ සිවිල් කාර්ය මණ්ඩලය සඳහා ලබාදෙන ආපදා ණය යෝජනා ක්‍රමයට අදාල ණය ලබාදීම හා අයකර ගැනීම් වලට අදාල කොන්දේසි ඇතුලත් වක්‍රලේඛයක් නිකුත් කිරීම හෝ ව්‍යවස්ථාවක් සකස් කර නොතිබුණි.
(ඇ) 1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් පනත	විද්‍යාලයේ සිවිල් කාර්ය මණ්ඩලය වෙනුවෙන් 2009 වර්ෂයේ සිට දායක මුදල් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල වෙත ගෙවා නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාණ්ඩලික විද්‍යාලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාව මාණ්ඩලික විද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

2.3 වෙනත් කරුණු

(අ) මාණ්ඩලික විද්‍යාලයේ අධ්‍යයන කටයුතු සඳහා අවශ්‍ය සිව්මහල් විභාග ශාලා සහ පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2017 ඔක්තෝබර් 06 දින රු.115,878,415 කට කොන්ත්‍රාත් සමාගමක් සමග ගිවිසුමකට එළඹ තිබුණි. 2018 දෙසැම්බර් 31 වන විට ගොඩනැගිල්ලේ වැඩ අවසන් කිරීමට අදාල අවසන් බිල්පතද ඉදිරිපත් කර තිබුණි. එසේ වූවද එම ගොඩනැගිල්ලේ ඉහල මහලේ ජල කාන්දු වීමක් නිසා විද්‍යාලය විසින් බිල්පත් ගෙවීම් අත්හිටුවා තිබුණු නමුත් බිල්පත් ගෙවීම අත්හිටුවා වසර දෙකක් ගතවී තිබුණද ජල කාන්දු වීමට අදාල අලුත්වැඩියා කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සිදුකර නොතිබුණි.

(ආ) ඉන්ධන මිලදී ගැනීම වෙනුවෙන් යුධ හමුදාවට ගෙවිය යුතු රු. 10,992,853 ක ණය ශේෂය වර්ෂ 5 කට වැඩි කාලයක සිට පියවා නොතිබුණි.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති